| සෘජු ඒකක ශිෂ්‍ය පිරිවැය | 161,757 | | 457,564 | 153,857 | 87,355 | 151,961 | 257,177 |
| සෘජු පරිපාලන පිරිවැය | | | | | | | |
| පොදු | 102,046,127 | ශිෂ්‍ය සංඛ්‍යාව | 8,254,929 | 25,633,726 | 35,382,146 | 25,986,733 | 6,788,593 |
| මූල්‍ය | 18,398,156 | ශිෂ්‍ය සංඛ්‍යාව | 1,488,302 | 4,621,570 | 6,379,137 | 4,685,214 | 1,223,933 |
| සැපයුම් | 9,476,502 | ශිෂ්‍ය සංඛ්‍යාව | 766,593 | 2,380,473 | 3,285,759 | 2,413,255 | 630,422 |
| ප්‍රවාහන | 40,526,867 | ශිෂ්‍ය සංඛ්‍යාව | 3,278,384 | 10,180,245 | 14,051,758 | 10,320,439 | 2,696,040 |
| ආරක්ෂක | 41,754,166 | ශිෂ්‍ය සංඛ්‍යාව | 3,377,665 | 10,488,540 | 14,477,296 | 10,632,979 | 2,777,685 |
| **එකතුව** | **212,201,818** | | **17,165,874** | **53,304,555** | **73,576,096** | **54,038,622** | **14,116,672** |
| සෘජු ඒක ශිෂ්‍ය පරිපාලන පිරිවැය | 56,467 | | 56,467 | 56,467 | 56,467 | 56,467 | 56,467 |
| **අධ්‍යයන සහායක සේවා** | | | | | | | |
| විභාග | 15,941,633 | ශිෂ්‍ය සංඛ්‍යාව | 1,289,584 | 4,004,497 | 5,527,394 | 4,059,644 | 1,060,513 |
| පුස්තකාල | 22,611,721 | ශිෂ්‍ය සංඛ්‍යාව | 1,829,155 | 5,680,006 | 7,840,094 | 5,758,227 | 1,504,239 |
| අධ්‍යයන තාක්ෂණ | 19,160,762 | ශිෂ්‍ය සංඛ්‍යාව | 1,549,992 | 4,813,134 | 6,643,553 | 4,879,417 | 1,274,665 |
| සෞඛ්‍යය | 3,279,870 | ශිෂ්‍ය සංඛ්‍යාව | 265,322 | 823,895 | 1,137,219 | 835,241 | 218,193 |
| ශාරීරික අධ්‍යාපන | 11,241,293 | ශිෂ්‍ය සංඛ්‍යාව | 909,354 | 2,823,784 | 3,897,660 | 2,862,671 | 747,824 |
| සේවක සහ ශිෂ්‍ය සුබසාධනය | 131,328,919 | ශිෂ්‍ය සංඛ්‍යාව | 10,623,734 | 32,989,489 | 45,535,280 | 33,443,793 | 8,736,623 |
| ඉඩම් හා ගොඩනැගිලි | 51,491,851 | ශිෂ්‍ය සංඛ්‍යාව | 4,165,387 | 12,934,621 | 17,853,614 | 13,112,746 | 3,425,482 |
| විදුලිය | 25,186,054 | ශිෂ්‍ය සංඛ්‍යාව | 2,037,403 | 6,326,672 | 8,732,684 | 6,413,798 | 1,675,496 |

| | | | පීඨ | | | | |
|---|---|---|---|---|---|---|---|
| | මුළු වියදම 2016 රු. | වියදම වෙන් කරන ලද පදනම | කෘෂි විද්‍යා පීඨය රු. | ව්‍යවහාරික විද්‍යා පීඨය රු. | කළමණාකරණ පීඨය රු. | සමාජ විද්‍යා පීඨය රු. | භූ විද්‍යාපන පීඨය රු. |
| ජලය | 943,731 | ශිෂ්‍ය සංඛ්‍යාව | 76,342 | 237,063 | 327,217 | 240,328 | 62,781 |
| උද්‍යාන අංශය | 1,295,302 | ශිෂ්‍ය සංඛ්‍යාව | 104,782 | 325,377 | 449,116 | 329,857 | 86,170 |
| පොදු කටයුතු | 15,400,936 | ශිෂ්‍ය සංඛ්‍යාව | 1,245,845 | 3,868,676 | 5,339,920 | 3,921,952 | 1,024,543 |
| **එකතුව** | **297,882,071** | | **24,096,900** | **74,827,215** | **103,283,752** | **75,857,675** | **19,816,529** |
| අධ්‍යයන සහායක ඒක පිරිවැය | **79,266** | | **79,266** | **79,266** | **79,266** | **79,266** | **79,266** |
| මුළු පිරිවැය | **1,117,968,314** | | **180,362,192** | **273,372,955** | **290,638,088** | **275,322,672** | **98,227,406** |
| ඒකක ශිෂ්‍ය පිරිවැය | **297,490** | | **593,297** | **289,590** | **223,088** | **287,693** | **392,910** |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1.1 ගිණුම් වාර්තාකරණ ආයතනය

සබරගමුව විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාලීය පනත යටතේ තැ.පෙ. 02 බෙලිහුල්ඔය යන ලිපිනයේ ස්ථාපිත කර ඇති අතර රාජ්‍ය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ජාතික විශ්වවිද්‍යාලයකි.

**1.1.2 ප්‍රධාන කර්තව්‍යයන් සහ ක්‍රියාකාරකම්**

විශ්වවිද්‍යාලය දේශීය සිසුන් සඳහා කෘෂිකාර්මික විද්‍යාව, සමාජවිද්‍යා හා භාෂා, ව්‍යවහාරික විද්‍යාල භූවිඥාපන, කළමණාකරණ අධ්‍යයන යන අංශ යටතේ පීඨ පවත්වාගෙන යනු ලබන අතර මෙම පීඨ යටතේ උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලබන අතර ඒ යටතේ උපාධි පිරිනමනු ලැබේ. විශ්වවිද්‍යාලය මගින් උසස් අධ්‍යාපන හා පරීක්ෂණ කටයුතු අභිවෘද්ධිය සඳහා කටයුතු කරනු ලැබේ. 2016 වර්ෂයේ සිට පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය ආරම්භ කර පශ්චාද් උපාධි පාඨමාලා පවත්වා ගෙන එනු ලැබේ.

**1.1.3 ගිණුම් පිළියෙල කිරීමේ මූලිකයන්**

**(a) ගිණුම් ප්‍රකාශනවල අනුකූලතාව**

ගිණුම් ප්‍රකාශනවල පහත සඳහන් ගිණුම් ප්‍රකාශ ඇතුලත් වේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය මූල්‍යකාර්ය සාදන වාර්ථාව, අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය, ශුද්ධ වත්කම් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ ගිණුම් සඳහා සටහන්.

සබරගමුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව උපචිත පදනමින් පිළියෙලකර ඇත. අනුගමනය කර ඇති සියලු ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අනුගමනය කර ඇති අතර යම් ගිණුම්කරණ වෙනස්වීමක් සිදු කර ඇත්නම් එකී වෙනස්වීමට අදාලව නියමිත පරිදි ගැලපීම් කර ප්‍රවර්ථන වර්ෂයේ සංසංදනාත්මකව පිළියෙල කර ඇත.

**(b) ඇගයීම් පදනම**

සබරගමුව විශ්වවිද්‍යාලයේ සියලු මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය සංකල්ප යටතේ ගිණුම් ගත කර ඇති අතර මෙම සංකල්පයෙන් බැහැරව ගිණුම්ගත කර ඇත්නම් ඒ පිළිබඳ පැහැදිලිව හෙළිදරව් කොට ඇත.

**(c) ගනුදෙනු කිරීමේ හා ගිණුම්ගත කිරීමේ මුදල් ඒකකය**

සබරගමුව විශ්වවිද්‍යාලයේ සියලු ගිණුම්ගත කිරීම් මූල්‍ය ඒකකය ලෙස රුපියල් අගය පදනම්ව පිළියෙල කර ඇත.

**(d) අඛණ්ඩ බව**

සියලු ගිණුම් දිගින් දිගටම පැවැත්වීමේ සංකල්පය යටතේ පිළියෙල කර ඇත.

**1.2 වත්කම් සහ එම වත්කම් අගය කිරීමේ පදනම**

**1.2.1 ඉඩම්, දේපල පිරියත සහ උපකරණ**

ඉඩම්, ගොඩනැගිලි, විද්‍යාගාර, උපකරණ, ඉගැන්වීමේ උපකරණ සියළු, සවිකිරීම්, පුස්තකාල පොත් හා වාර්ෂික වාර්ථා මෝටර් වාහන උපාධි ලෝගු සහ අනෙකුත් වත්කම් ස්ථාවර වත්කම් තුළ ඇතුළත් වන අතර මෙම වත්කම් රජයේ ප්‍රදාන, පරීක්‍ෂණ ප්‍රදාන, පරිත්‍යාග සහ උත්පාදිත අරමුදල් මගින් මිලදී ගැනීම හෝ ඉදිකිරීම කර ඇත.

**(a) හඳුනාගැනීම් හා මැනීම්**

සියලුම දේපල පිරියත හා උපකරණ වල අනාගත අර්ථික ඵලදායීතාවයන් ආයතනය තුළට ගලා එන පිරිවැය පැහැදිලිව හඳුනාගත් වත්කම් දේපල පිරියත හා උපකරණ ලෙස ගණනය කර පිරිවැයෙන් සමුච්චිත ක්‍ෂය අඩුකර ගිණුම් වල ඉදිරිපත් කර ඇත.

**(b) පිරිවැය**

සියලුම දේපල පිරියත හා උපකරණ වල අගය ලෙස එම දේපල මිළදී ගැනීමට හෝ ඉදිකිරීමට උපයෝගී කර ගත් පිරිවැය සහ එම දේපල පිරියත ආර්ථිකමය වශයෙන් උපයෝජනය කරගැනීම සඳහා එම තත්වයට ගෙන ඒමට දරණ ලද පිරිවැය ඇතුළත් කර ඇත.

**(c) පවතින වත්කම් සඳහා පසු කාලීනව දැරූ පිරිවැය**

පවතින සියලුම ස්පෘශ්‍ය වත්කම් සඳහා පසුව දැරූ වියදම් පහත සඳහන් ගනයට නොවැටෙන අවස්ථාවලදී එම වියදම් දැරූ වර්ෂයේ කාර්ය සාධන වාර්ථාවට වියදම් ලෙස ඇතුළත් කර ඇති අතර අනෙකුත් සෑම විටම වත්කම් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශන වලට ඇතුළත් කර ඇත.

* අදාල වත්කමෙහි වෙළෙඳපල වටිනාකම ඉහලයෑම
* වත්කමෙහි ධාරිතාව ඉහලයෑම
* වත්කමෙහි නිෂ්පාදිතයන්හි ප්‍රමිතිය ඉහල යෑම හෝ මෙහෙයුම් පිරිවැය පහල යෑම
* අදාල පිරිවැය නිසා එම දේපලහි ඵලදායී ජීවිත කාලය ඉහල යෑම

**(d) ක්‍ෂය වෙන් කිරීම්**

ඉඩම් සඳහා ක්‍ෂය වෙන්කිරීම් නොකරනු ලබන අතර අනෙකුත් සියලුම දේපල පිරියත සඳහා දේපල වල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන සෘජු ක්‍රමය යටතේ ක්‍ෂය වෙන් කරනු ලැබේ. ප්‍රවර්ථන වර්ෂයේ සියලු ක්‍ෂය වෙන්කිරීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ඇතුළත් කොට ඇත. ඇස්තමේන්තු ගත ඵලදායී ජීවිත කාලය පහත දක්වා ඇත.

| **ක්‍ෂය වෙන් කිරීම්** | **ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය** |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 20 |
| ජල පිරිපහදු යන්ත්‍ර | අවුරුදු 20 |
| කාර්යාල හා ඉගැන්වීමේ උපකරණ | අවුරුදු 05 |
| පරිගණක උපකරණ | අවුරුදු 05 |
| පුස්තකාල පොත් හා වාර්ෂික ප්‍රකාශන | අවුරුදු 05 |
| තොරතුරු හුවමාරුව උපකරණ | අවුරුදු 05 |

| **ක්ෂය වෙන් කිරීම්** | **ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය** |
|---|---|
| මෝටර් රථ වාහන | අවුරුදු 05 |
| උපාධි සාධක | අවුරුදු 05 |
| අනිකුත් උපකරණ | අවුරුදු 05 |

ක්ෂය වෙන් කරනු ලබන සියලුම ස්ථාවර වත්කම් සඳහා මිලදී ගත් දිනය නොසලකා මිලදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණ ක්ෂය වෙන් කරනු ලබන අතර ඉවත් කරනු ලබන වර්ෂය සඳහා ක්ෂය වෙන් කරනු නොලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අංක 649 දරන චක්‍රලේඛණය පදනම් කර ගෙන ක්ෂය වෙන් කිරීමේ රේටයන් යොදාගෙන ඇති අතර මෙම රේටයන් 2006 මුදල් වර්ෂයේ සිට අඛණ්ඩව පවත්වාගෙන එනු ලබන අතර ඉදිරියේදීත් මෙම රේටයන් තබා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම ක්ෂය අනුපාතයන් සබරගමුව විශ්වවිද්‍යාලයේ 20-01-2007 පැවති 117 වන පාලක සභාව විසින් අනුමත කර ඇත.

විශ්ව විද්‍යාලය විසින් 2007 වසරේ මිලදී ගනු ලබන අංක SGKE 9206 ලැබූ කාර් රථය 2016 වසරේ අනතුරට පත්වීමෙන් ඉවත් කිරීමට සිදු වූ අතර මේ සඳහා වාහනය රක්ෂණය කර තිබූ ජාතික රක්ෂණ භාරකාර අරමුදල් ආයතනයෙන් ගෙවීමට එකඟ වූ රු. 2,650,000.00ක මුදල යථා කාලයේදී ලැබීමට හෙයින් මුළු මුදල රක්ෂණ ලැබිය යුතු මුදල් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වාර්තා කර ඇත. රක්ෂණ ලැබිය යුතු මුදල් හා වාහනයේ ශුද්ධ අගය අතර වෙනස 2016 මූල්‍ය කාර්ය සාදන වාර්තාවේ කර ඇත.

(e) **ප්‍රාග්ධන ස්වරූපයේ කෙරීගෙන යන වැඩ**

ප්‍රාග්ධන ස්වරූපයේ කෙරීගෙන යන වැඩ පිරිවැය මත ගිණුම්ගත කර ඇත. ප්‍රාග්ධන ස්වරූපයේ වර්ෂය තුළ කෙරීගෙන යන වැඩ කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දක්වා ඇති අතර වර්ෂය තුළ සම්පූර්ණ වශයෙන් නිම වී භාවිතාවට ගනු ලබන කෙරීගෙන යන වැඩ තුළ ඇති වත්කම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කොට ඇත.

**1.2.2 අස්පෘශ වත්කම්**

පිරිවැය පැහැදිලිව හඳුනාගත් අනාගත ආර්ථික ඵලදායීතාවයන් ආයතනයට ගලා එන වත්කම් පමණක් අස්පෘශ වත්කම් ලෙස දක්වා ඇත.

සියලුම අස්පෘශ වත්කම් පිරිවැය මත අගය කර ඇති අතර වර්තමාන තත්ත්වයට ගෙන ඒමට දැරූ සියලුම වියදම් ඇතුළත් කර ඇත. ගිණුම්වල පිරිවැයෙන් ක්‍රමක්ෂය අඩු කර ඉදිරිපත් කර ඇති අතර ප්‍රාග්ධනගත කිරීමෙන් පසුව දරණ වියදම් එම වියදම් නිසා වත්කම් අනාගත ප්‍රාග්ධන ඵලදායීතාවය වර්ධනය වන්නේ නම් පමණක් වත්කම් වටිනාකමට එකතු කර ඇත. සියලුම අස්පෘශ වත්කම්වලට සීමිත ඵලදායී ජීවන කාලයක් ඇති බැවින් එම ජීවන කාලය හා සුංබුං අගය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පදනම ගණනය කර ඇති අතර ක්‍රමක්ෂය පදනම අනුගමනය කර ඇත. ඒ අනුව පහත අස්පෘශ වත්කම්වල ඵලදායී ජීවන කාලය ගණනය කර ඇත.

(a) පරිගණක මෘදුකාංග වර්ෂ 5 ජීවිත කාලයට සෘජු ක්‍රමය අනුව

(b) විෂයමාලා සන්සන්දන පිරිවැය වර්ෂ 5ක ජීවිත කාලයකට සෘජු ක්‍රමය අනුව

HETC ව්‍යාපෘතිය යටතේ ලැබූ පරිගණක මෘදුකාංග පිරිවැයෙන් ක්‍රමක්ෂය අඩුකර එම වර්ෂයේ ගිණුම්ගත කර ඇත.

**1.2.3 විෂයමාලා ප්‍රතිසංශෝධනය**

විශ්වවිද්‍යාලය විසින් වර්ෂ 5කට වරක් විෂයමාලා ප්‍රතිසංශෝධනය කර මෙම වියදම ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගතකොට වර්ෂ 5ක කාලයක් තුළ ක්‍රමක්ෂය ලෙස කපා හරිනු ලැබේ. කළමණාකරණ අධ්‍යයන පීඨය සහ භූවිඥාපන පීඨය සඳහා 2015 වසරේ විෂයමාලා ප්‍රතිසංශෝධනය කටයුතු සිදු කොට ඇති අතර මේ සඳහා දරන ලද වියදම 2015 වසරේ සිට වසර 5 තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. කෘෂිවිද්‍යා පීඨය හා ව්‍යවහාරික විද්‍යා පීඨය 2016 වර්ෂයේ සිට නව සංශෝධනය කළ විෂය මාලා ක්‍රියාත්මක කරන බැවින් ප්‍රාග්ධනගත කළ එම පීඨවල විෂයමාලා සංශෝධිත පිරිවැය 2016 සිට ක්‍රමක්ෂය කර ඇත.

**1.2.4 බුද්ධි අභිවෘද්ධිය සඳහා වියදම්**

සේවක බුද්ධි අභිවෘද්ධිය සඳහා කරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස හඳුනා ගන්නා අතර මෙම වියදම වසර 5ක කාලයක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

**1.2.5 පශු සම්පත්**

පශු සම්පත් වාර්ෂික ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර එහි අතිරික්තය හෝ ඌණතාවය කාර්ය සාධන වාර්තාවෙහි ගැලපීම් කරනු ලැබේ.

**1.2.6 තොග**

තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි යන අගයන් ගෙන අඩු අගයට ගිණුම්ගත කොට ඇති අතර සාමාන්‍යයෙන් පළමු ලැබූ පළමු නිකුත් කිරීම පදනමින් පිරිවැය ගණනය කර ඇත.

තොග අගය කිරීමේ දී පිරිවැය හා තොග වර්තමාන තත්ත්වයට ගෙන ඒමට දැරූ සියලුම වියදම් ඇතුළත් කර ඇත.

**1.2.7 ලැබිය යුතු ලැබීම්**

සියලු ලැබීම් උපලබ්ධිවීම් පදනමින් ගිණුම්ගත කොට ඇත.

**1.2.8 විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රතිපත්ති අංක 20 ට අනුව සියලුම පර්යේෂණ වියදම් ප්‍රවර්ථන වර්ෂයේ සිට ගිණුම්ගතකොට ඇත. ඒ අනුව සියලුම පර්යේෂණ වියදම් ප්‍රාග්ධන ප්‍රදාන මගින් එම වසරේම කාර්ය සාදන වාර්තාවේ වියදම ලෙස ගිණුම්ගත කර ඇත. යම් පරීක්‍ෂණයක් මගින් සොයා ගැනීම් පසුව සංවර්ධනය කරන්නේ නම් පමණක් සංවර්ධන වියදම ලෙස ප්‍රාග්ධනිත කරනු ලැබේ.
මෙම ගිණුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මත 2015 වසර දක්වා ප්‍රාග්ධනිත කළ රු. 55,57,453 වියදම මෙම වසරේ වියදම ලෙස ඉදිරියට ගෙන ආ සමුච්චිත අතිරික්තය /ඌණතාව ගැලපීම් කර ඇත. 2016 වසරේ පරීක්‍ෂණ ප්‍රදාන මුළු එකතුව රු. 56,11,980.00 වූ වියදම වියදම ලෙස කාර්ය සාදන වාර්ථාවේ දක්වා ඇත.

**1.2.9 මුදල් සහ මුදල් සමානයන්**

මුදල් සහ මුදල් සාමානයන් ලෙස අතැති මුදල් සහ බැංකු තැන්පතු ඇතුළත් කොට ඇත.

**1.3 වගකීම් සහ වෙන් කිරීම්**

මූල්‍ය තත්ත්වය ප්‍රකාශිත දිනට හඳුනාගත හැකි සියලුම වගකීම් වගකීම් ලෙස ගිණුම් ගත කොට ඇති අතර හඳුනාගත් නමුත් වගකීම් මුදල පැහැදිලිව හඳුනාගත නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් පරිදි වෙන් කිරීම් සිදු කර ඇත.

ඉල්ලූ විට ගෙවිය යුතු හෝ ඊළඟ ගිණුම් වර්ෂය තුළ ගෙවිය යුතු සියලු වගකීම් ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇති අතර අනෙකුත් සියලු වගකීම් ජංගම නොවන වගකීම් ලෙස දක්වා ඇත.

**1.3.1 සේවක ප්‍රතිලාභ**

(a) **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මගින් සේවකයින් විශ්‍රාමයෑමේ දී ගෙවිය යුතු ප්‍රතිලාභ හඳුනාගෙන ඇත.

**පාරිතෝෂික වෙන් කිරීම්**

1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනත අනුව විශ්වවිද්‍යාලය මගින් සේවක පරිතෝෂික වෙන් කිරීම් කර ඇත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම යටතේ යටතේ සේවයෙන් විශ්‍රාම යෑමේ දී වයස සහ සේවා කාලය පදනමින් ප්‍රතිලාභ හඳුනාගන්නා අතර විශ්වවිද්‍යාලය මගින් ගිණුම් පිළියෙල කරන දිනට විශ්වවිද්‍යාලයේ සේවය කරනු ලබන විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වර්ෂ 5 ක කාලයක් සම්පූර්ණ කළ සියලුම සේවකයින් සඳහා පාරිතෝෂික වෙන් කිරීම් කර ඇත. එහිදි ඉදිරියට ගෙනඑන ලද වෙන්කිරීම් ශේෂයෙන් වාර්ෂිකව කරන ලද පාරිතෝෂික ප්‍රමාණය අඩුකොට වර්ථමාන ගිණුම් වාර්තා කරනු ලබන දිනට පාරිතෝෂික පනත යටතේ ගණනය කරනු ලැබූ ශේෂය ගැලපීම් කොට යම් වෙනසක් වේ නම් එම වෙනස කාර්ය සාධන ප්‍රකාශයට ගලපා ඇත. වාර්ෂික වෙන්කිරීම් වගකීම් ආයෝජනය කර නොමැත.

(b) **නිශ්චිත දායකත්ව සැලසුම්**

නිෂ්චිත දායකත්ව සැලසුම පසු සේවා නියුක්තිය පදනමින් ස්ථිර දායකත්ව කරනු ලබන අතර වැඩි මුදලක් ගෙවීමට ආයතනය බැඳී නොමැත. දායකත්ව වගකීම් සඳහා වෙන් කිරීම කර නොමැති අතර ගෙවිය යුතු බවට හඳුනාගත් විට පමණක් ගෙවී ම් ලෙස ගිණුම්ගත කරනු ලබයි.

**විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සහ විශ්වවිද්‍යාල**

විශ්වවිද්‍යාලයේ සේවය කරනු ලබන සියලුම විශ්වවිද්‍යාලීය සේවකයින්ගේ මූලික වැටුපෙන් 10% සේවකයින්ගෙන් අයකර විශ්වවිද්‍යාලය මගින් මූලික වැටුපෙන් 15% මුදලක් එයට එක් කර මුළු මුදලම ( 15%+10%) විශ්වවිද්‍යාලීය සේවක අර්ථසාධක අරමුදලට දායක කරනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් අරමුදලට දායක වීමට කැමැත්ත පලකර ඇති සේවකයිත් සඳහා ඉහත විශ්වවිද්‍යාලය මගින් දායක කරනු ලබන 15% මුදලින් 8% ක් විශ්වවිද්‍යාලීය සේවක විශ්‍රාම වැටුප් අරමුදලට දායක කරනු ලැබේ.

**සේවා නියුක්තයින්ගේ භාර අරමුදල**

**1.3.2 කල්බදු**

**මූල්‍ය කල්බදු**

සියලුම හිමිකම් හා වගකීම් වත්කම් භාවිතා කරනු ලබන පුද්ගලයා දරන හිමිකම වත්කමට භාවිතා කරන්නාට හිමිවන කල්බදු මූල්‍ය කල්බදු ලෙස ගිණුමට දක්වා ඇත. මූලිකව හඳුනා ගැනීම හා තක්සේරු කිරීම හා කල්බදු වගකීම් ලෙස දක්වා ඇති වත්කම් හා වගකීම් අවම කල්බදු ගෙවීම් පදනම්කර ගිණුම් ගත කර ඇත. පසුව කල්බදු වාරික ගෙවීම් මූල්‍ය ගාස්තු සහ ගෙවිය යුතු වගකීම් අඩුවීම අතර පලදායී පොලී ක්‍රමයම අනුව විභාජනය කර ඇත.

**1.3.3 ප්‍රදාන ගිණුම්ගත කිරීම්**

වියදම් දැරීම සඳහා ප්‍රවර්තන වර්ෂයේ වියදම් සඳහා ලැබූ සියලුම පුනරාවර්ථන ප්‍රදාන ප්‍රවර්ථන වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් ලෙස ගිණුම් ගත කොට ඇත. ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් සඳහා ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රාග්ධන ප්‍රදාන මත මිලදි ගත් හෝ ඉදිකරන ලද වත්කම් වල ආර්ථික ඵලදායී ජීවන කාලය පදනම් කරගෙන (විලම්භිත ආදායම්) ලෙස ගිණුම්ගත කොට ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව විශ්වවිද්‍යාලය මගින් සියලුම ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග සඳහා ආදායම් පදනම මත 2014-01-01 දින සිට ගිණුම් පවත්වාගෙන යනු ලබන අතර ඉදිරියටත් මෙම ක්‍රමය අනුගමනය කරනු ලැබේ.

**1.3.4 අවිනිශ්චිත වගකීම්**

පහත සඳහන් අධිකරණ මගින් විභාග වන නඩු සඳහා විශ්වවිද්‍යාලයට එරෙහිව තීන්දු ලැබුණහොත් ඒ සඳහා වන්දි ගෙවීමට සිදුවිය හැක. මෙම නඩු මේ වන විටත් විභාග වෙමින් පවතින අතර එම නඩු සඳහා යම් ගෙවීමක් ගෙවීමට සිදු වුවහොත් එම වගකීම් ප්‍රමාණය අවිනිශ්චිත වන අතර එම මුදල ගිණුම් ඉදිරිපත් කරන දිනට තක්සේරු කළ නොහැකි හෙයින් මෙසේ ඉදිරිපත් කරමි.

***01*** ***දිස්ත්‍රික් අධිකරණය***

| | |
|---|---|
| 3917/M | එම්. ඩී. එල්. ඩී .කේ. යටවර |
| 3918/M | එම්. ඩී. එල්. ඩී. කේ. යටවර |
| 3401/M | පොලිටෙක් ජැනිටෝරියල් සේවය (එල් ඒ කේ සිල්වා) |
| 4248/M | ඩබ්. එම්. දිපිකා ප්‍රියදර්ශනී |
| 3947/M | ඒ. අනුරාධ රොඩ්රිගෝ |
| 3121/M | ඩී. බී. පී. ජයතිස්ස |
| 3299/M | ඒ. එම්. පී. එම්. කරුණාරත්න |
| 3555/M | ඩී. එම්. රත්නායක |
| 4708-විශේෂ | ඒ. මහින්ද මෙත්සිරි |

***02*** ***ශ්‍රේෂ්ඨාධිකරණය***

| | |
|---|---|
| 13/2015 | ඩී ටී වික්‍රමරත්න |
| 267/2014 | බී එම් ඩී ජී ඒ ඩී බණ්ඩාර අබේරත්න |
| 09/15 | ආර් එච් ඒ එස් එස් කරුණාරත්න |
| එච්සීසීජ්එල්ඒ | 344/6 එම් විමලදාස ද සිල්වා |

***03*** ***අභියාචනාධිකරණය***

| | |
|---|---|
| 3555/එ | ටී එම් එස් එල් ප්‍රියදර්ශක |
| 3555/එ | එම් විමලදාස ද සිල්වා |

***04*** ***මහාධිකරණය***

| | |
|---|---|
| 37/2012-LTA | පී අනුර බණ්ඩාර |
| 38/2012-LTA | බී පී ගාමිනී අනුර |
| 35/2012-LTA | ඩී බී ජේ විජේරත්න |
| 36/2012-LTA | කේ කිත්සිරි දයානන්ද |
| 34/2012-LTA | උපාලි අමරසේන රණතුංග |
| HC/ARB 349/2014 | සැලසුම් උපදේශක |
| HC/ARB 349/2013 | සැලසුම් උපදේශක |

***05*** ***මානවහිමිකම් කොමිසම***

| | |
|---|---|
| HRC/642/15 | එච් එම් ජී පී ගුණතිලක |
| HRC/35/98/15 | කේ ඩබ් එස් තිලකරත්න |
| HRC/29/58/2015 | ඩබ් පී ඇල්විටිගල |
| IR/COM/05/H/2015/30 | පී බී ප්‍රසාද් |
| PTD/227/G/2014 | ආර් ඒ උදය කුමාර |
| 11643/TP | ආර් ඒ උදය කුමාර |
| BC1489/2014/b-25 | එම් එල් කේ එම් දිසානායක |
| | එම් එම් විමලසිරි සහ එම් එම් ඉනිදීර |
| HRC/751/16(CP/LRR/HR/59 | එල් ගුරුගේ |

***06*** ***මහේස්ත්‍රාත් අධිකරණය***

| | |
|---|---|
| 51445/12 | පොලිසිය වත්තේ ළමයිට එදිරිව |
| 51445/12 | පොලිසිය වත්තේ |

***07*** **බේරුම්කරණාධිකරණය**

ICLPRef. No.238(i) සැලසුම් උපදේශක

***08*** **කම්කරු විනිශ්චය සභාව**

**1.4 ආදායම් වාර්තාව**

**1.4.1 ආදායම් හඳුනා ගැනීම**

සියලු ආදායම් උපචිත පදනමින් හඳුනාගෙන ඇත.

(a) පොලී ආදායම් උපචිත පදනමින් හඳුනාගෙන ඇත.
(b) ප්‍රදාන ලැබුවා වූ කාලපරිච්ඡේදය පදනමින් හඳුනාගෙන ඇත.
(c) අනුග්‍රහයන් ආදායම් ලැබීම් පදනමින් හඳුනා ගෙන ඇත.
(d) අනෙකුත් සියලු ආදායම් උපචිත පදනමින් හඳුනාගෙන ඇත.
(e) රජයේ ප්‍රදාන

රජයේ ප්‍රදාන ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස වර්ගීකරණය කර ඇති අතර පුනරාවර්තන ආදායම් ආදායම් ලෙස හඳුනාගෙන ඇති අතර ස්ථාවර වත්කම් මිල දී ගැනීම සඳහා භාවිතා කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රාග්ධන භාණ්ඩ ක්ෂය පදනම මත විලම්භිත ආදායම් ලෙස ප්‍රවර්තන වර්ෂයේ සහ පසුව ආදායමට හඳුනාගනු ලැබේ. මුළු රාජ්‍ය ප්‍රදාන ලෙස ප්‍රවර්තන වර්ෂයේ ලැබූ රු. 1,323,396,600 පහත වර්ගීකරණයේ දක්වා ඇත.

| | *2016* | *2015* |
|---|---|---|
| රාජ්‍ය ප්‍රදාන පුනරාවර්තන | 1,018,900,000 | 891,508,158 |
| රාජ්‍ය ප්‍රදාන මහපොළ ශිෂ්‍යත්ව | 57,906,800 | 59,044,750 |
| රාජ්‍ය ප්‍රදාන ශිෂ්‍යාධාර | 51,589,800 | 29,953,800 |
| රාජ්‍ය ප්‍රදාන ස්ථාවර වත්කම් පුනරුත්තාපන | 60,000.000 | 25,000,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන උපකරණ පොත් හා වාර සඟරා | 90,000,000 | 82,000,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන ඉදිකිරීම් | 40,000,000 | 50,000,000 |
| බුද්ධි වර්ධන හා මානුෂීය ප්‍රවර්ධන | 5,000,000 | 10,300,000 |
| එකතුව | 1,323,396,600 | 1,147,806,708 |

**1.4.2 වියදම්**

සියලු වියදම් උපචිත පදනමින් ගිණුම් ගත කර ඇති අතර එම වියදම් මගින් උත්පාදනය කරන ලද ආදායමට එරෙහිව ගිණුම්ගත කොට ඇත.

**1.5 සන්සන්දනාත්මක තොරතුරු**

සන්සන්දනාත්මක තොරතුරු අවශ්‍යතැන්හි වර්තමාන ගිණුම් ඉදිරිපත් කරන ස්ථානවල දක්වා ඇත.

**1.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය අනුගමනය කරමින් පිළියෙල කර ඇත.

**1.7 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 03 අනුව පෙර වර්ෂවලට අදාළ පහත සඳහන් අගයන් පොදු සංචිත ගිණුමට ගැලපීම් කර ඇත.**

පහත අගයන් පොදු සංචිත ගිණුමට හර කර ඇත.

(a) රු. 167,300.00 තොග
(b) රු. 8,500.00 ආදායම්
(c) රු. 6,310.00 සංග්‍රහ දීමනා ගෙවීම්
(d) රු. 13,422.77 හිඟ අතිකාල ගෙවීම්
(e) රු. 27,060.00 රඳවාගැනීම් නැවත ගෙවීම
(f) රු. 38,380.00 රඳවාගැනීම් නැවත ගෙවීම
(g) රු. 31,500.00 නීතිඥ ගාස්තු ගෙවීම
(h) රු. 52,500.00 නීතිඥ ගාස්තු ගෙවීම
(i) රු. 77,700.00 නැවත ගෙවීම්

(j) රු. 68,398.00 උපචිත වියදම්
(k) රු. 225,455.34 HETC ව්‍යාපෘතිය
(l) රු. 319,599.58 කෙරීගෙන යන වැඩ
(m) රු. 274.00 උපචිත වියදම්
(n) රු. 20,574.44 ආපදා ණය
(o) රු. 555,745.00 විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන
(p) රු. 1,096,713.51 ජාත්‍යන්තර සම්මන්ත්‍රණ -2015
(q) රු. 46,000.00 ක්ෂය වෙන්කිරීම් මෝටර් රථ
(r) රු. 162,454.00 විලම්භිත ආදායම් පරිත්‍යාග
(s) රු. 10,108,669.00 විවෘත හා දුරස්ථ අධ්‍යයන ඒකකයේ ගිණුම්
(t) රු. 534,541.13 ව්‍යාපෘති අත්තිකාරම්
(u) රු. 184,015.20 සමුච්චිත ක්ෂය වෙන්කිරීම් අනෙකුත් උපකරණ

**පහත අගයන් බැර සටහන් ලෙස ගැලපීම් කර ඇත.**

(v) රු. 167,300.00 උපාධි ලෝගු
(w) රු. 1,295.34 ආදායම්
(x) රු. 68,398.20 උපචිත වියදම්
(y) රු. 1,055,228.95 "SANDEE" පර්යේෂණ ප්‍රදාන
(z) රු. 179,710.08 උපචිත වියදම්
(aa) රු. 1,908,200.00 මහපොල ආදායම්
(bb) රු. 2,304,500.00 ශිෂ්‍යාධාර ආදායම්
(cc) රු. 81,940.09 උපචිත වියදම් පුනරාවර්තන
(dd) රු. 10,291,046.34 උපචිත වියදම් පුනරාවර්තන
(ee) රු. 2,744,785.94 උපචිත වියදම් පුනරාවර්තන
(ff) රු. 1,060,964.69 උපචිත වියදම් පුනරාවර්තන
(gg) රු. 464,063.03 උපචිත වියදම් පුනරාවර්තන
(hh) රු. 666.00 උපචිත වියදම්
(ii) රු. 300,223.50 පාරිතෝෂික වැඩිපුර වෙන්කිරීම්
(jj) රු. 162,454.00 ක්ෂය කාර්යාල සහ ඉගැන්වීම් උපකරණ
(kk) රු. 1,555,075.20 ක්ෂය වෙන් කිරීම් - මෝටර් රථ
(ll) රු. 4,359,682.64 වැඩිපුර වෙන් කිරීම් උපචිත වියදම්
(mm) රු. 509, 696.41 වැඩිපුර වෙන් කිරීම් උපචිත වියදම්
(nn) රු. 521,574.00 බෙහෙත් තොග
(oo) රු. 25,949.60 විදේශ ශිෂ්‍යයින් සඳහා ශිෂ්‍යත්ව
(pp) රු. 1,871,603.20 ආර්ථික සංවර්ධන අමාත්‍යංශ ප්‍රදාන
(qq) රු. 567,885.28 ආර්ථික සංවර්ධන අමාත්‍යංශ ප්‍රදාන
(rr) රු. 160,000.00 ආරම්භක පරීක්ෂණ ප්‍රදාන
(ss) රු. 6,600.00 දිරිමත් කිරීමේ පරීක්ෂණ ප්‍රදාන
(tt) රු. 24,026.83 වාර්ෂික භුවිඥාපන කඳවුර

**1. 8 අන්තර් සමාගම් ගිණුම්**

21වන සියවස සඳහා උසස් අධ්‍යාපන ප්‍රදාන (HETC GTANT)

උක්ත ප්‍රදාන යටතේ උපාධි අධ්‍යයන සිසුන්ගේ තොරතුරු තාක්‍ෂණ ඉංග්‍රීසි අධ්‍යාපන සහ මානුසීය කුසලතා වර්ධනයට සහ පශ්චාද් උපාධි අධ්‍යයන සිසුන්ගේ පරීක්‍ෂණ සහ සංවර්ධනය වැඩිදියුණු කිරීම පිණිස ලබා දෙන ලදි. එම ප්‍රදාන යටතේ 2012 සිට 2016 දක්වා ලැබූ මුදල් පහත දක්වා ඇත. මෙම මුදල් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොමැත.

| **විස්තරය** | **මුදල** |
|---|---:|
| විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන | 22,435,284 |
| බාහිර උපාධි වැඩ සටහන් ප්‍රදාන | 10,028,688 |
| IDS ප්‍රදාන | 18,234,413 |
| ගුණත්ව වැඩි දියුණු කිරීමේ ප්‍රදාන QIG | 36,131,404 |
| මානව සම්පත් වැඩිදියුණු කිරීම් ප්‍රදාන | 20,847,339 |
| මුළු එකතුව | 107,687,628 |

මෙම ප්‍රදාන යටතේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා රු.77,827,930 ක් හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්ය උපාධි සඳහා රු. 20,078,188.81 වැය කර ඇත. මෙම වටිනාකම් අනුව එම මුදල් වියදම් කළ වර්ෂයේ සිට 2016.01.01 වැනි දින දක්වා අදාල වත්කම් වලට අදාල ක්‍ෂය වෙන් කිරීම් රේටයන් පදනම් කොටගෙන ක්‍ෂය වෙන් කර ශුද්ධ අගය ගිණුම් ගත කර ඇත. ගිණුම්ගත කළ වටිනාකම රු. 66,638.85 කි. මෙකී වත්කම් ක්‍ෂය පදනමින්ම අදාල ප්‍රදානය ක්‍රමක්‍ෂය කර විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව ගිණුම්ගත කර ඇත.

**1. 9 අන්තර් සමාගම් ගිණුම්**

ගිණුම් පිළියෙල කිරීමේ දී විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන විවෘත හා දුරස්ථ අධ්‍යාපන ඒකකයෙන් රු. 27,916,037.94ක ප්‍රමාණය විශ්වවිද්‍යාලය මගින් විවෘත හා දුරස්ථ අධ්‍යාපන ඒකකයට ගෙවිය යුතු මුදල් ලෙසද විවෘත හා දුරස්ථ අධ්‍යාපන ඒකකයේ ගිණුම්වල එම ඒකකයට විශ්වවිද්‍යාලයෙන් ලැබිය යුතු ලැබීම් ලෙසද සඳහන් කර ඇති අතර මෙම මුදල අවසාන ගිණුම් පිළියෙල කිරීමේ දී එකිනෙකට කපාහැර ඉදිරිපත් කර ඇත.

06 - 310

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංක : 2113178.
රොෂාන් හේමන්ත යහළකොටුව.
ධනුෂ්කා නදීෂානි මාතරආරච්චි.

2018 අප්‍රේල් මස 27 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් සහතික කරන ලද 2016.07.25 වැනි දින අංක 1868 සහ නාවලපිටිය ප්‍රසිද්ධ නොතාරිස් පී. එල්. එන්. ජයසිංහ (ආටිගල) විසින් සහතික කරන ලද 2017.05.23 වැනි දින අංක 3466 දරන කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් ලියන ලද්දාවූ බැඳුම්කරයන් යටතේ රොෂාන් හේමන්ත යහලකොටුව බන්ධනදායි/උකස්කරු වශයෙන් හා ධනුෂ්කා නදීෂානි මාතරආරච්චි යන අය බන්ධනදායි වශයෙන් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හැත්තෑනම ලක්ෂ හැත්තෑනවදහස් නමසියපහයි ශත හැත්තෑ තුනක (රු. 7,979,905.73) මුදලක් 2018.03.20 වැනි දින වන විට කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හැත්තෑනම ලක්ෂ හැත්තෑ නවදාස් නමසියපහයි ශත හැත්තෑ තුනක (රු. 7,979,905.73) මුදල හා 2018.03.21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 7,198,500.00 ක මුදලක් සඳහා වාර්ෂිකව 16% බැගින් වූ වැඩි දුර පොළිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අය කර ගැනීම සඳහා එකී

අංක 1868, 3466 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපල හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම පස්බාගේ කෝරළේ, නාවලපිටිය නගර සභා සීමාවන් තුළ පස්බාගේ කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නාවලපිටිය බටහිර ග්‍රාම නිලධාරි වසම අංක 1088, බව්වාගම ගමේ පිහිටි පොල්වත්ත නැමති ඉඩමට බලයලත් මානක කේ. ඒ. අමරතුංග විසින් 2015.10.11 වැනි දින මැන සාදන ලද අංක 10571 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 05 නැමති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : පිඹුරු අංක 10571 ලොට් අංක 2 සහ 4 න්ද සහ ලොට් 03 (අඩි 12ක් පළල පාර) සහ පෙදෙරෙරු කානුවෙන් ද, නැගෙනහිරට : පී. ආර්. බී. දිනේශ් තරංග සහ පී. වී. පුෂ්පානන්ද යන අයට අයත් ඉඩම් වෙන් වෙන කම්බි වැටෙන් ද, දකුණට : එම්. එච්. ධම්මිකා මාලිනිට අයත් ඉඩම වෙන් වෙන වැටෙන් ද සහ බස්නාහිරට : එම්. එච්. ධම්මිකා මාලිනිට අයත් ඉඩම වෙන් වෙන වැටෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගහ, කොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් තිස් හයයි දශම පහයි බිංදුවක් විශාල ඉඩම (අ. 0, රූ. 0, පර්. 36.50) මෙය ගම්පොල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 98/29 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරු අංක 10571 ලොට් 03 මාර්ගය දිගේ ඔස්සේ හා උඩින් පාවිච්චි කිරීමේ සම්පූර්ණ අයිතිය ද සමගින් ද වේ.

රංජනි ගමගේ මිය,
සමාගම් ලේකම්.

06 - 384

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 2005372.
පොන්නයියා ඥානනාතන්.

2018 අප්‍රේල් මස 27 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද 2016.05.04 වැනි දින අංක 21582, 2016.09.09 වැනි දින අංක 21780 සහ 2016.10.10 වැනි දින අංක 21808 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.හි නමින් ලියන ලද්දා වූ බැඳුම්කරයන් යටතේ පොන්නයියා ඥානනාතන් යන අය බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැට හතර ලක්ෂ දාහතරදාස් අටසිය තිස්හතයි ශත තිස්හතක (රු. 6,414,837.37) මුදලක් 2018.03.12 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හැට හතර ලක්ෂ දාහතරදාස් අටසිය තිස්හතයි ශත තිස්හතක (රු. 6,414,837.37) මුදල හා 2018.03.13 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,833,315.00 ක මුදලක් සඳහා වාර්ෂිකව 12.50% බැගින් වූ වැඩි දුර පොළිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අය කර ගැනීම සඳහා එකී අංක 21582, 21780 සහ 21808 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපල හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මැදිකින්ද මහපළාත කෝරළේ, බණ්ඩාරවෙල නගර සභා දැන් මහ නගර සභා සීමාව තුළ කැඹිල්ලවෙල ග්‍රාම නිලධාරි වසම හි කැඹිල්ලවෙල ගමේ පිහිටි දොඹගොඩැල්ලේ පතන නැමති ඉඩමට බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් 1972.11.05 වැනි දින මැන සාදන ලද අංක 1147 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 45 නැමති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : ඉහත කී පිඹුරේ ලොට් ආර් 04 ද, නැගෙනහිරට : ලොට් අංක 46 න් ද, දකුණට : ලොට් අංක 10AL සහ බස්නාහිරට : ලොට් ආර් 1 සහ ආර් 3 න් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් තිස්දෙකක් විශාල ඉඩම (අ. 0, රූ. 0, පර්.32)

මෙය බදුල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව J 75/129 ලියාපදිංචි කර ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මැදිකින්ද මහපළාත කෝරළේ, බණ්ඩාරවෙල නගර සභා දැන් මහ නගර සභා සීමාව තුළ කැඹිල්ලවෙල ග්‍රාම නිලධාරි වසම හි කැඹිල්ලවෙල ගමේ පිහිටි දොඹගොඩැල්ලේ පතන නැමති ඉඩමට බලයලත් මානක ඩී. සුදත් අරුණ රංජන විසින් 2016.03.18 වැනි දින මැන සාදන ලද අංක 2284 බී දරන පිඹුරේ

නිරූපිත බෙදා වෙන් කළ ලොට් බී නැමති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : මෙම පිඹුරේ ලොට් ඒ ද, නැගෙනහිරට : බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් 1972.11.05 වැනි දින මැන සාදන ලද අංක 1147 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 46 න් ද, දකුණට : ලොට් 10AL සහ බස්නාහිරට : බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් 1972.11.05 වැනි දින මැන සාදන ලද අංක 1147 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක ආර් 1 සහ ආර් 3 න් ද යන මේකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩම් ප්‍රමාණය පර්චස් විසි එකක් විශාල ඉඩම (අ. 0, රූ. 0, පර්. 21) හෝ හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි පහයි තුනක් (0.053 හෙ.යා.)

පහත විස්තර කරන ලද මාර්ග ප්‍රවේශය උඩින් යටින් සහ ඔස්සේ පොදුවෙන් පාවිච්චි කිරීමේ සම්පූර්ණ අයිතිය සමගින් ද වේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මැදිකින්ද මහපළාත කෝරළේ, බණ්ඩාරවෙල නගර සභා දැන් මහ නගර සභා සීමාව කැඹිල්ලවෙල ග්‍රාමනිලධාරී වසම හි කැඹිල්ලවෙල ගමේ පිහිටි දොඹගොඩැල්ලේ පතන නැමති ඉඩමට බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් 1972.11.05 වැනි දින මැන සාදන ලද අංක 1147 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් ආර් 1 (අඩි 30ක් පළල පාර සඳහා වෙන් කිරීම) නැමති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉහත කී පිඹුරේ ලොට් 1, 15, 16, 41, 42, ආර් 3 සහ 43න් ද, නැගෙනහිරට : ලොට් අංක 2, 14, ආර්. 2, 15, 16 සහ 45 න් ද, දකුණට : පිඹුරු අංක 340233 නිරූපිත මාර්ග ප්‍රවේශය සහ Kit 19ආර් සහ බස්නාහිරට : පිඹුරු අංක 340233 නිරූපිත ලොට් ආර් 10න් ද යන මේකී මායිම් තුළ පිහිටි අනෙකුත් සියලු දේ . ඉඩමේ ප්‍රමාණය අක්කර එකයි පර්චස් විසි දෙකයි දශම බිංදුවයි පහක් විශාල ඉඩම (අ. 01, රූ. 0, පර්. 22.05) මෙය බදුල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව J 73/189 ලියාපදිංචි කර ඇත.

රංජනි ගමගේ මිය,
සමාගම් ලේකම්.

06 - 388

---

## සෙලාන් බැංකුව පීඑල්සී - මඩකලපුව ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියා පදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.04.27 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0730-33525880-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජෙගනාදන් විසින් සහතික කරන ලද 2016 ජූලි 25 දිනැති අංක 920 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මඩකලපුව ව්‍යාපාර ලියා පදිංචි අංක පීපී/එෆ්/එන්/ඒ/ආර් බී/15 දරන ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය යටතේ රාක්සි කන්ස්ට්‍රක්ෂන් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන තුරෙයිරාජා සුරෙන්තිරන් හෙවත් තුරෙයිරාජා සුරේන්ද්‍රන් යන අය බන්ධනදායී වශයෙන් රු. 8,344,575.46 මුදලක් 2017 සැප්තැම්බර් මස 07 වැනි දින සිට සීයයට දහහතරයි දශම පහක (14.5%)ක පොලිය සමග රුපියල් අසූහත් ලක්ෂ එක්දහස් හාරසිය නවයයි ශත පනස් අටක (රු. 8,701,409.58) මුදලක්, සමාන වාරික ණය පහසුකම සම්බන්ධයෙන් එකී බැඳුම්කරය මත 2017 සැප්තැම්බර් මස 06 වැනි දින වන විට මුල් මුදල සහ පොලිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී මුළු මුදලවන රුපියල් අසූහත් ලක්ෂ එක්දහස් හාරසිය නවයයි ශත පනස් අටක (රු. 8,701,409.58) මුදලක් 2017 සැප්තැම්බර් මස 07 වැනි දින සිට පෙර කී පොලිය සමග විකිණීමේ දිනය දක්වා කාලයට, ප්‍රසිද්ධ කිරීමේ වියදම සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 920 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උගක් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ මඩකලපුව මහ නගර සභා සීමාව තුළ පෙරිය උප්පෝදෙයි වෝඩ් අංක 8 හි 178ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ සින්න උප්පෝදෙයි ගමේ කුඩා ලේන් හි පිහිටි වරිපනම් අංක 38/12ඒ සහ 38/12හි දරන බලයලත් මිනින්දෝරු කේ. කමලනාදන් විසින් අඳින ලද 2013.06.05 සහ 2013.06.20 දිනැති අංක කෙකේ/බීටී/2013/800ඊ දරන සැලැස්මේ ලොට් අංක 04 ලෙස නිරූපණය වන උප්පෝදෙයි වලවු නමැති ප්‍රමාණයෙන් හෙක්ටයාර් යාර 0.0418ක් නොහොත් පර්චස් දහසයයි දශම පහයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 16.25) විශාල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : පෙර කී අංක කේකේ/බීටී/2013/800ඊ දරන සැලැස්මේ සඳහන් ලොට් අංක 05 ද, ගිණිකොණට : එස්. මනෝහරන්ගේ ඉඩම ද, නිරිතට : මීටර් 04

ක් පළල පටු මග ද සහ වයඹට : පෙරකී අංක කේකේ/බීටී/2013/800ඊ දරන සැලැස්මේ ලොට් අංක 03 ලෙස නිරූපනයවන මීටර් 03 ක් පළල පටුමග, එමගින් නිරිත දෙසින් සහ වයඹ දෙසින් ඇතුල්වීමට සහ පිටවීමට අයිතිය සමග එයවට අයත් සියලු අයිතින් සමග

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
නීති ප්‍රධානී.

06 - 485

---

## සෙලාන් බැංකුව පීඑල්සී - කඩවත ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවූ 9 යටතේ ලියා පදිංචි කර ඇත

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 අප්‍රේල් මස 27 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0280-012742266-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ටී. කේ. කළුආරච්චි විසින් දෙකම සහතික කරන ලද 2016.12.23 දිනැති අංක 1454 සහ 1455 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, රාජගිරිය සිය ලියාපදිංචි කාර්යාලය පිහිටුවා ඇති ලියාපදිංචි අංක පීවී 117452 දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන පික්සාර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් රුපියල් පනස්හයලක්ෂ තිස් හය දහස් තුන්සිය විසිහයයි ශත හතලිස් හතරක (රු. 5,636,326.44) මුදලක් මත, 2017 දෙසැම්බර් 20 වැනි දින සිට වසරකට සියයට විස්ස (20%) බැගින් පොලිය සමග වාර ණය 1 සම්බන්ධයෙන් එකී බැඳුම්කරය මත රුපියල් පනස්නව ලක්ෂ අසූනවදහස් නවසිය හැට නවයයි ශත තිස් එකක (රු. 5,989,969.31) මුදලක්, 2017 දෙසැම්බර් 19 වැනි දින වන විට මුල් මුදල සහ පොලිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රු. 5,989,969.31, 2007 දෙසැම්බර් මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට පෙර කී පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම සහ දරන්නට වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 1454 සහ 1455 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිටකෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 522බී තුළ පිටකෝට්ටේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්.එල්.එන්. පෙරේරා විසින් සාදන ලද 2009.03.19 දිනැති අංක 4511 සැලැස්මේ නිරූපනය වන කුඩාවලවත්ත හෙවත් කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 22 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 25/1 සහ 33 (එපිටමුල්ල පාර) ද, නැගෙනහිරට : ලොට් 23 ද, දකුණට : ලොට් 7 ද, බස්නාහිරට : ලොට් 21 ද යන මායිම් තුළ පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ගොඩනැගිලි, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. ඉහත සඳහන් ඉඩම පිඹුරු අංක (සීඕ.) 169ඒ හි සඳහන් ලොට් 22 හි නැවත මැනීමක් වේ.

පෙරකී පිටකෝට්ටේ පිහිටි බලයලත් මිනින්දෝරු සී.එම්.ඩී. අබේගුණවර්ධන විසින් සාදන ලද 1983 සැප්තැම්බර් 08 වැනි දිනැති අංක සීඕ/169ඒ සැලැස්මේ නිරූපනය වන කුඩාවලවත්ත හෙවත් කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 22 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එපිටමුල්ල පාර ද, නැගෙනහිරට : ලොට් 23 ද, දකුණට : ලොට් 7 ද, බස්නාහිරට : ලොට් 21 ද යන මායිම් තුළ පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
නීති ප්‍රධානී.

06 - 486

## සෙලාන් බැංකුව පීඑල්සී - කටුනේරිය ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියා පදිංචි කර ඇත.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2018.03.26 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0550-34309237-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සාමගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2014.03.20 දිනැති අංක 1351, 1352 සහ 1353 සහ 2011.11.28 දිනැති අංක 1773, 1774, 1775 සහ 2015.07.16 දිනැති අංක 1530 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම කටුනේරිය පදිංචි අන්ද්‍රා හෙන්නැදිගේ දයා නිශ්ශංක සහ වීරකොන්ඩච්චිගේ කැතරින් ප්‍රනාන්දු හෙවත් වීරකොන්ඩ ආරච්චිගේ මරියා කැතරින් ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් රු. 37,228,415.18 මුදලක්, 2017 නොවැම්බර් 25 වැනි දින සිට වසරකට සියයට විසි අට (28%) බැගින් පොලිය සමග ඔහුට ප්‍රදානය කරන ලද ස්ථිර අයිරා අණකර පහසුකම සම්බනධයෙන් සහ රු. 9,048,000.00 ක මුදලක් මත 2017 නොවැම්බර් 25 දින සිට වසරකට සියයට දහ නවය (19%) බැගින් පොලිය සමග එකී බැඳුම්කර මත ඔහුට ප්‍රදානය කරන ලද වාර ණය පහසුකම සම්බන්ධයෙන් රු. 9,517,670.38 ක මුදලක් 2017 නොවැම්බර් 24 වැනි දින වන විට මුල් මුදල සහ පොලිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් හාරකෝටි හැටහත්ලක්ෂ හතලිස් හය දහස් අසූපහයි ශත පනස්හයක (රු. 46,746,085.56) (ස්ථිර අයිරා අණකර පහසුකම වාර ණය පහසුකම මුළු හිඟ මුදල) පෙරකී පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී අංක 1351, 1352, 1353, 1773, 1774, 1775, 1530 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමු උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළේ, යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තෝඩුවාව උතුර අංක 531/ඒ ග්‍රාම නිලධාරීගේ කොට්ඨාසය තුළ තෝඩුවාව දකුණු ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලසේන විසින් සාදන ලද 2014.02.19 දිනැති අංක 5272 සැලැස්මේ නිරූපණය වන නුගගහවත්ත නැමති ඉඩමේ ලොට් 02 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර (පී එස්) ද, නැගෙනහිරට : ඩබ්ලිව්. ඒ. ජස්ටින් ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, දකුණට : කැලිස්ටර් වර්ඩර්ලැන්ඩ් විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලසේන විසින් සාදන ලද 1996.05.22 දිනැති අංක 1217 සැලැස්මේ සඳහන් ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් තිහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්.3 0.5) විශාල ගොඩනැගිලි, ගස්, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත විස්තර කරන ලද ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ.

පෙර කී තෝඩුවාව දකුණ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලසේන විසින් සාදන ලද 1996.05.22 දිනැති අංක 1217 සැලැස්මේ නිරූපනය වන නුගගහවත්ත නමැති ඉඩමේ ලොට් 02 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : ඩබ්ලිව්. ඒ. ජස්ටින් ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, දකුණට : කැලිස්ටර් වන්ඩර්ලැන්ඩ් විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, බස්නාහිරට : එකී සැලැස්මේ සඳහන් ලොට් 01 ද යන මායිම් තුළ පර්චස් තිහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 30.5) විශාල ගොඩනැගිලි, ගස් සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව කේ47/291 හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළේ යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තෝඩුවාව උතුර අංක 531/ඒ ග්‍රාම නිලධාරීගේ කොට්ඨාසය තුළ තෝඩුවාව දකුණ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලසේන විසින් සාදන ලද 2014.02.19 දිනැති අංක 5273 සැලැස්මේ නිරූපණය වන තෝඩුවාව එස්ටේට් සහ පලුගහහේන නමැති ඉඩමේ ලොට් 01 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ජේ. ඒ. ඇලඩීන් අප්පු විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : කේ. එස්. මල්ලිකාගේ ඉඩම ද, දකුණට : ප්‍රධාන පාරේ සිට නිවෙස්වලට යන පාර (පීඑස්), බස්නාහිරට : එන්. ඩබ්ලිව්. පී. මේරි මාගරට් විසින්

හිමිකම් කියනු ලබන ඉඩම ද යන මායිම් තුළ පර්චස් තිස් අටයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 38.5) විශාල ගොඩනැගිලි, ගස්, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත විස්තර කරන ලද ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ.

පෙර කී තෝඩුවාව දකුණ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩී. පෙරේරා විසින් සාදන ලද 1999.01.21 දිනැති අංක 2648 සැලැස්මේ නිරූපණය වන තෝඩුවාව එස්ටේට් සහ පලුගහහේන නමැති ඉඩමේ ලොට් 01 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ජේ. ඒ. ඇලඩින් අප්පු ගේ ඉඩම ද, නැගෙනහිරට : කේ. එස්. මල්ලිකාගේ ඉඩම ද, දකුණට : පාර ද, බස්නාහිරට : එන්. ඩබ්ලිව්. පී. මේරි මාගරට් ගේ ඉඩමද යන මායිම් තුළ පර්චස් තිස් අටයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 38.5) විශාල ගොඩනැගිලි, ගස් සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/ පත්ඉරුව කේ.55/284 හි ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ.

**තුන්වෙනි උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළේ යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මැද තෝඩුවාව අංක 531/බී ග්‍රාම නිලධාරීන්ගේ කොට්ඨාසය තුළ තෝඩුවාව දකුණ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලසේන විසින් සාදන ලද 2014.02.19 දිනැති අංක 5274 සැලැස්මේ නිරූපණය වන පල්ලියවත්ත නැමති ඉඩමේ ලොට් 01 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර (පීඑස්) ද, නැගෙනහිරට : කැමිලස් ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, දකුණට : ඩබ්ලිව්. ආර්. එන්. රංජිත් ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, බස්නාහිරට : පාර (මහා මාර්ග) තල්විල සිට හලාවතට ද යන මායිම් තුළ පර්චස් දහහතරයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 14.2) විශාල ගොඩනැගිලි, ගස්, සහ එහි පිහිටි වෙනත් සියලුම දේ සමග ඉඩම.

ඉහත විස්තර කරන ලද ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ.

පෙර කී තෝඩුවාව දකුණ පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. එප්. එච්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1998 මාර්තු 02 සහ 03 දිනැති අංක 2947 සැලැස්මේ නිරූපණය වන පල්ලියවත්ත නමැති ඉඩමේ ලොට් 01 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : වීසී පාර ද, නැගෙනහිරට : කැමිලස් ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : එකී සැලැස්මේ සඳහන් ලොට් 02 ද බස්නාහිරට : පාර (මහා මාර්ග) තල්විල සිට හලාවතට ද යන මායිම් තුළ පර්චස් දහහතරයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 14.2) විශාල ගොඩනැගිලි, ගස්, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව කේ 93/235 හි ලියාපදිංචි කර ඇත.

**හතරවෙනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ හේවාගම් කෝරළේ මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ හේන්පිට, අංක 451 ග්‍රාම නිලධාරිගේ කොට්ඨාසය තුළ හේන්පිට (අඹුල්ගම) පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඉද්දමල්ගොඩ විසින් සාදන ලද 2007.06.12 දිනැති අංක 10089 සැලැස්මේ නිරූපණය වන හෙට්ටියාවත්ත හෙවත් දොඹගහවත්ත නමැති ඉඩමේ ලොට් 02 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී සැලැස්මේ සඳහන් ලොට් 01 සහ පාර (මහා මාර්ගය) ද, නැගෙනහිරට : පාර (මහා මාර්ග) සහ හෙට්ටියාවත්ත හෙවත් දොඹගහවත්ත ද, දකුණට : හෙට්ටියාවත්ත හෙවත් දොඹගහවත්ත ද බස්නාහිරට : ගොඩැල්ලවත්ත සහ එකී සැලැස්මේ සඳහන් ලොට් 01 ද යන මායිම් තුළ පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්. 18) විශාල ගොඩනැගිලි, ගස් සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත විස්තර කරන ලද ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ.

පෙරකී හේන්පිට (ඇඹුල්ගම) පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඉද්දමල්ගොඩ විසින් සාදන ලද 1989.01.09 දිනැති අංක 2995 සැලැස්මේ නිරූපනය වන හෙට්ටියාවත්ත හෙවත් දොඹගහවත්ත නමැති ඉඩමේ ලොට් 02 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී සැලැස්මේ සඳහන් ලොට් 01 සහ පාර (මහා මාර්ගය) ද, නැගෙනහිරට : පාර (මහා මාර්ග) සහ හෙට්ටියාවත්ත හෙවත් දොඹගහවත්ත ද, දකුණට : හෙට්ටියාවත්ත හෙවත් දොඹගහවත්ත ද බස්නාහිරට : ගොඩැල්ලවත්ත සහ එකී සැලැස්මේ සඳහන් ලොට් 01 ද යන මායිම් තුළ පර්චස් දහඅටක් (අ. 0, රූ, 0, පර්. 18) විශාල ගොඩනැගිලි, ගස් සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ 538/32 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මිය,
නීති ප්‍රධානී.

06 - 487

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 1935410.
පිළිදුව බෝගහවත්තගේ ප්‍රේමවති දොඩම් ගොඩගේ ප්‍රියන්ත.

2017 ජූලි මස 27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් S. R. විජේසිංහ විසින් 2008 ජූලි මස 15 වැනි දින සහතික කරන ලද අංක 2046, 2012 ජුනි මස 01 වැනි දින සහතික කරන ලද අංක 4051, 2013 ජුනි මස 17 වැනි දින සහතික කරන ලද අංක 4590, 2013 මාර්තු 05 වැනි දින සහතික කරන ලද අංක 5050 සහ 2014 නොවැම්බර් මස 14 වැනි දින සහතික කරන ලද අංක 5485 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි නමට ලියන ලද්දාවූද බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පිළිදුව බෝගහවත්තගේ ප්‍රේමවති සහ දොඩම් ගොඩගේ ප්‍රියන්ත ණයකරුවන් සහ පිලිදුව බෝගහවත්තගේ ප්‍රේමවති උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් එක්කෝටි අසූපන් දහස් එකසිය අසූ හයයි ශත දොළහක (රු. 10,085,186.12) මුදලක් 2017 ජුනි මස 13 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක්කෝටි අසූපන් දහස් එකසිය අසූ හයයි ශත දොළහක (රු. 10,085,186.12) මුදල අය කර ගැනීම සඳහා සහ 2017 ජුනි මස 14 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 9,350,000.00 ක මුදල මත AWPLR + 2.5% (වර්තමාන අනුපාතිකය 14.29%) වැඩිපුර වාර්ෂික පොළියද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවාද අඩුකොට එකී අංක 2046, 4051,4590, 5050 සහ 5485 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට උකස් කොට ඇත්තා වූද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ 12 හල්ෆ්ඩොප් වීදියේ 2 වන මහලේ අංක 200 හි පිහිටි ත්‍රිවංක සහ සේනානයක වෙන්දේසිකරුවන් හි අනුශ්‍රාලත් වෙන්දේසිකරු L. B. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධයක්ෂක මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ, අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බට - අත (දකුණ) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බට -අත ගමේහි පිහිටි රජයේ ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම් වශයෙන් උතුරට : W. A. අර්නොලිස් හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : R. P. බේබි හාමි හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : උඩගම පටුමගෙන් ද සහ බස්නාහිරට : පටුමගෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් තුනක (අ. 0, රූ. 03, පර්. 0) විශාලත්වයෙන් වූ ඉඩම සමග වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඉඩම් සංවර්ධන ආඥා පනතේ හම්/ 14/3012/97 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම මැතකදී මැනීමකින් පසු මෙහි පහත සඳහන් පරිදි විස්තර වේ.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බට - අත (දකුණ) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බට -අත ගමේ හි පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු L. K. ගුණසේකර විසින් 2002 මැයි මස 12 වැනි දින මැන සාදන ලද අංක 3362 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : W. A. අර්නොලිස් හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : R. P. බේබි හාමි හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : රජයේ ඉඩමෙන් ද සහ බස්නාහිරට : පාරක් සඳහා වෙන් කරන ලද ඉඩමෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් තුනක (අ. 0, රූ. 03, පර්. 0) විශාලත්වයෙන් වූ ඉඩම සමග වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

රංජනී ගමගේ මිය,<br>සමාගම් ලේකම්.

2017 අගෝස්තු මස 08 වැනි දින,

06 - 501

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඔයිල්ටා වර්ජින් ඔයිල්.<br>ගිණුම් අංක : 0183 1000 0945.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.04.26 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. ඩී. සුබසිංහ යන අය විසින් ලියා සහතික කරන ලද 2015 අප්‍රේල් මස 02 දාතම හා අංක 2421 දරන උකස් බැඳුම්කරය

මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "ඔයිල්ටා වර්ජින් ඔයිල්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන සුදසිංහ මංචනායක අප්පුහාමිලාගේ ගැමුණු උදයසිරි යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර ඇති හෙයින්ද, එකී අංක 2421 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක්කෝටි විසි තුන් ලක්ෂ අසූ අට දහස් පන්සිය අනූ පහයි ශත තිස් දෙකක (රු. 12,388,595.32) මුදලක් 2018 මාර්තු මස 15 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් එක්කෝටි විසි තුන් ලක්ෂ අසූ අට දහස් පන්සිය අනූ පහයි ශත තිස් දෙකක (රු. 12,388,595.32) මුදලද, 2018 මාර්තු මස 16 වැනි දින සිට අංක 2421 දරන එකී බැඳුම්කරය මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි දහසය ලක්ෂ පනස් දහසක (රු. 11,650,000.00) at the rate of Average Weighted Deposit Rate + Two decimal Five per centum (2.5%) per annum බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2421 දරන එකී බැඳුම්කරය මඟින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසි කරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ බලවල අංත 56 AC ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ හොරකන්දවිල පිහිටි " තිඹිරිගහවත්ත, දෙල්ගහවත්ත සහ තලගහකුඹුර" යයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන එච්. ඩී. රූපසිංහ යන අය විසින් සාදන ලද 1997 මාර්තු මස 11 දාතම හා අංක 1011 දරන පිඹුරේ නිරූපිත ඉඩම) බලයලත් මානක තැන එස්. සෙනරත් යන අය විසින් සාදන ලද 2004 සැප්තැම්බර් 26 දාතම හා අංක 2497 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරටඃ ප්‍රධාන පාර සහ ප්‍රාදේශීය සභා පාර, නැගෙනහිරට : ප්‍රාදේශිය සභා පාර, දකුණට : සේකර මුදලි යන අය විසින් හිමිකම් කියනු ලබන කුඹුර කේ. ඒ. කරුණාවතී යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : කේ. ඒ. කරුණාවතී යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි හතරක් (0A., 1R., 24P.) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු සේ සමග එකී අංක 2497 දරන පිඹුරට අනුව වෙළුම/ පත්ඉරුව E 1093/207 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

06 - 502

---

### සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

නිව් බුද්ධික බජාජ් සෙන්ටර්.
ගිණුම් අංක : 0183 1000 0317.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.04.26 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එන්. කේ. කරුණාතිලක යන අය විසින් ලියා සහතික කරන ලද 2012 නොවැම්බර් මස 29 දාතම හා අංක 438 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "නිව් බුද්ධික බජාජ් සෙන්ටර්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන මාපා පතිරන්නැහැලාගේ බුද්ධික උදය කුමාර මාපා පතිරණ යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර ඇති හෙයින්ද, එකී අංක 438 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හැට හය ලක්ෂ දෙදහස් තුන්සිය පනස් තුනයි ශත හැට හතක (රු. 6,602,353.67) මුදලක් 2018 මාර්තු මස 21 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් හැටහය ලක්ෂ දෙදහස් තුන්සිය පනස් තුනයි ශත හැට හතක (රු. 6,602,353.67) මුදලද 2018 මාර්තු මස 22 වැනි දින සිට අංක 438 දරන එකී බැඳුම්කරය මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ හතලිස් පන් දහස් පන්සිය හැත්තෑවක (රු. 245,570) මුදලක් සඳහා at the rate of 5 years Treasury Bond Rate + Two per centum (2%) පොළියද, හා තවත් රුපියල් පහළොස්

ලක්ෂයක (රු. 1,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයයි දශම පහක් (10.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 438 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දාසිය පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අස්සෙන්නවත්ත සහ වටිනපහ ග්‍රාමවල පිහිටි "කහටගහලන්ද සහ ගොකැලේ" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. පී. එස්. වික්‍රමසිංහ යන අය විසින් සාදන ලද 2002 ඔක්තෝබර් මස 13 දාතම හා අංක 1404 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඇළ, නැගෙනහිරට : ඇළ සහ පාර (මා. සං. අ), දකුණට : පාර (මා. සං. අ) සහ එම්. පී. සෙනවිරත්න යන අයගේ මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : එම්. පී. සෙනවිරත්න යන අයගේ මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (0A., 0R., 15P.) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී අංක 1404 දරන පිඹුරට අනුව මෙම වෙළුම/ පත්‍රිරුව A 291/270 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

06 - 503

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

කේ. මුතුකුමාර්.
ගිණුම් අංක : 1042 5715 0083.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.04.26 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2017 අප්‍රේල් මස 06 දාතම හා අංක 5471 උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කුමාරසාමි මුතුකුමාර් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර ඇති හෙයින්ද, එකී අංක 5471 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක්කෝටි තිස් පන් ලක්ෂ අසූ දෙදහස් පන්සිය විසි අටයි ශත හයක (රු. 13,582,528.06) මුදලක් 2018 මාර්තු මස 19 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි තිස් පන් ලක්ෂ අසූ දෙදහස් පන්සිය විසි අටයි ශත හයක (රු. 13,582,528.06) 2018 මාර්තු මස 20 වැනි දින සිට අංක. 5471 දරන එකී බැඳුම්කරය මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි විසි පන් ලක්ෂ හැට නම දහස් හයසිය හැට හතයි ශත පනස් තුනක (රු.12,569,667.53) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 5471 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ කැළණිය ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ වෙලේගොඩ අංක 256/B දරන ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ හුණුපිටියේ පිහිටි කාන්ති මාවත වරිපනම් අංක 52/34 දරන "කමතගොඩැල්ල" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා යන අය විසින් සාදන ලද 2008 සැප්තැම්බර් මස 24 දාතම හා අංක 2624 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා යන අය විසින් සාදන ලද 1988 ඔක්තෝබර් 03 දාතම හා අංක 1285 දරන පිඹුරේ ලොට් A, නැගෙනහිරට : බේබි නෝනා යන අය විසින් හිමිකම් කියනු ලබන කිඹුලාකොටුව කුඹුර දකුණට : බලයලත් මානක තැන කේ. ඩී. ෆීලික්ස්, ආර්. පෙරේරා

යන අය විසින් සාදන ලද 1988 ඔක්තෝම්බර් 03 දාතම හා අංක 1285 දරන පිඹුරේ ලොට් B හි කොටසක් සහ බස්නාහිරට : කාන්ති මාවත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම නමයයි එකක් (0A., 0R., 10.91P.) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2624 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 වඩා නිවැරදිව පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි:

එකී හුණුපිටිය පිහිටි "කමතගොඩැල්ල" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා යන අය විසින් සාදන ලද 1989 මැයි මස 31 දාතම හා අංක 1295 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා යන අය විසින් සාදන ලද 1988 ඔක්තෝබර් 03 දාතම හා අංක 1285 දරන පිඹුරේ ලොට් A, නැගෙනහිරට : බේබි නෝනා යන අය විසින් හිමිකම් කියනු ලබන කිඹුලාකොටුව කුඹුර, දකුණට : මෙම ඉඩමේ කොටසක් සහ බස්නාහිරට : පාර (බලයලත් මානක තැන කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා යන අය විසින් සාදන ලද අංක 991 දරන පිඹුරේ ලොට් 9) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි (0A., 0R., 10P.) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 1295 දරන පිඹුරට අනුව වෙළුම/ පත්‍රිරුව G 174/15 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ, යටින් හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය :-

බලයලත් මානක තැන කේ. බාලසුන්දරම් යන අය විසින් සාදන ලද 1976 පෙබරවාරි මස 01 දාතම හා අංක 04/1976 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 C (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

06 - 504

---

## යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මාර්තු මස 28 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අහංගම, දික්කුඹුර, පනුගල්ගොඩවත්ත යාගල යන ස්ථානයේ පදිංචි ලලිත නුවන් වන්නිආරච්චි (ජාතික හැඳුනුම්පත් අංක 831880554V දරන) (මෙහි මින්මතු ඇතැම් තැනක ''බන්ධනදායි'' වශයෙන් හඳුන්වන) යන අය විසින් මූල්‍ය පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායි විසින් රුපියල් අනූනවලක්ෂයක (රු. 9,900,000) මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් කීර්ති කළුආරච්චි විසින් සහතික කරන ලද අංක 4443 සහ 2015.11.02 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, ඉහත කී මූල්‍ය පහසුකම් මත ලියාපදිංචි අංක PB 676 PQ දරන යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු ඇතැම් තැනක "යූනියන් බැංකුව"වශයෙන් හඳුන්වන.) වෙත අයවිය යුතු රුපියල් අනූනවලක්ෂයක (රු. 9,900,000) මුදල සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඉහත කී මූල්‍ය පහසුකම් නිසා 2018.01.21 වැනි දිනට ශ්‍රී ලංකා රුපියල් හැටහතරලක්ෂ හැටහත්දහස් හයකුත් ශත හැටහතක (රු. 6,467,006.67) මුදල සහ ඒ මත තවදුරටත් පොළිය මෙහි පහත සඳහන් පරිදි එකී බන්ධනදායිගෙන් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද, එනම්,

1. 2018.01.21 වැනි දිනට වාර ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් දහසයලක්ෂ හැත්තෑහත්දහස් එකසිය පනස් හතකුත් ශත අසූවක (රු. 1,677,157.80) මුදල සහ මුල් හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් පහළොස් ලක්ෂ හැටදහසක (රු. 1,560,000) මුදල මත 2018.01.22 වැනි දින සිට දේපල විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 19.5% බැගින් තවදුරටත් පොළිය,

2. 2018.01.21 වැනි දිනට අයිරා පහසුකම මත මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් හතළිස් හත්ලක්ෂ අසූනවදහස් අටසිය හතළිස්අටකුත් ශත අසූහතක (රු. 4,789,848.87) මුදල සහ ඒ මත 2018.01.22 වැනි දින සිට දේපල විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 28% බැගින් තවදුරටත් පොළිය,

ඉහත කී ණය ශේෂය හෝ ඉන් යම් කොටසක් එකී බන්ධනදායි විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදු කර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත කී මූල්‍ය පහසුකම් නිසා ඉහත දක්වා ඇති පරිදි 2018.01.21 වැනි දිනට එකී බන්ධනදායිගෙන් යූනියන් බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතු ශ්‍රී ලංකා රුපියල් හැටහතරලක්ෂ හැටහත්දහස් හයකුත් ශත හැටහතක (රු. 6,467,006.67) මුදල සහ ඒ මත 2018.01.22 වැනි දින සිට දේපල විකිණීමේ දිනය තෙක් ඉහත දක්වා ඇති පරිදි තවදුරටත් පොළිය ද, තව ද, ඉහත කී අංක 4443 දරන උකස් බැඳුම්කරය

සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වන වගන්තිය යටතේ යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලු ම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා එකී අංක 4443 දරන උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ, ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කොරලේ, පිටබැද්දර ප්‍රාදේශීය සභා සීමාවේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර රඹුකන ග්‍රාම නිලධාරී වසමේ රඹුකන පිහිටි මෝදරවිලහේන නමැති ඉඩමට මාතර බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන විසින් මැන සාදන ලද අංක 4491 සහ 2012.09.09 වැනි දින දරන පිඹුර ප්‍රකාර (කැබලි අංක A දරන බිම් කොටසේ යාබද ඉඩම් කැබලි අංක 11 සහ 12 දරන බිම් කොටස්වල ඒකාබද්ධ කිරීමක් වන බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන විසින් මැන සාදන ලද අංක 994 සහ 1994.02.21 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 දරන බිම් කොටසේ නැවත මැන අනුබෙදීමක් වන) කැබලි අංක 1A දරන බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට සහ ඊසානට : මෙම ඉඩමේ ම කොටසක් ද, දකුණට : මොරවක නෙළුව ප්‍රධාන මාර්ගයට වැටී ඇති ප්‍රවේශ මාර්ගය ද, නිරිතට : මෙම ඉඩමේ ම කැබලි අංක 1B දරන බිම් කොටස ද, බස්නාහිරට : මෙම ඉඩමේම කොටසක් ද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර පහක් (අ. 5, රූ. 0, පර්. 0) විශාල බිම් කොටස, එහි පස ඒ මත පිහිටි ගහකොළ පලතුරු ආදි සෑම සියලු දේත් සමඟය. මෙම කොටපොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 159/297 දරන වෙළුමේ සහ පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

සහ තව ද,

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කොරලේ, පිටබැද්දර ප්‍රාදේශීය සභා සීමාවේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර රඹුකන ග්‍රාම නිලධාරී වසමේ රඹුකන පිහිටි මෝදරවිලහේන නමැති ඉඩමට මාතර බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන විසින් මැන සාදන ලද අංක 4491 සහ 2012.09.09 වැනි දින දරන පිඹුර ප්‍රකාර (කැබලි අංක A දරන බිම් කොටසේ යාබද ඉඩම් කැබලි අංක 11 සහ 12 දරන බිම් කොටස්වල ඒකාබද්ධ කිරීමක් වන බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන විසින් මැන සාදන ලද අංක 994 සහ 1994.02.21 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 දරන බිම් කොටසේ නැවත මැන අනුබෙදීමක් වන) කැබලි අංක 1B දරන බෙදා වෙන්කළ බිම් කොටසට මායිම් උතුරට : මෙම ඉඩමේ ම කොටසක් ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ම කැබලි අංක 1A දරන බිම් කොටස ද, දකුණට : මොරවක නෙළුව ප්‍රධාන මාර්ගයට වැටී ඇති ප්‍රවේශ මාර්ගය ද, නිරිතට : මොරවක නෙළුව ප්‍රධාන මාර්ගයට වැටී ඇති ප්‍රවේශ මාර්ගය ද, යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර දෙකකුත් රූඩ් දෙකයි පර්චස් විසිහතරක් (අ. 2, රූ. 2, පර්. 24) විශාල බිම් කොටස, එහි පස ඒ මත පිහිටි ගහකොළ පලතුරු ආදි සෑම සියලු දේත් සමඟය. මෙම දේපල කොටපොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 196/121 දරන වෙළුමේ සහ පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06 - 539

---

## යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මාර්තු මස 28 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ "සන්තෝසම් ෆාම්" යන නාමය විලාසය සහ අභිධානය යටතේ තනිහිමිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යන, තෝඩුවාව, ශාන්ත ඇන්තනී මාවතේ, අංක 316A දරන ස්ථානයේ පදිංචි සාගර නිලන්ත වායි ඩැනියෙල් හෙවත් සාගර නිලන්ත වායිඩැනියෙල් (ජාතික හැඳුනුම්පත් අංක 843441831V දරන) (මෙහි මින්මතු ඇතැම් තැනක "බන්ධනදායී" වශයෙන් හඳුන්වන.) යන අය විසින් මූල්‍ය පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී විසින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපල සම්බන්ධයෙන් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. තිසේරා විසින් සහතික කරන ලද අංක 1756 සහ 2014.08.01 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය අංක 1834 සහ 2014.09.04 වැනි දින දරන ද්විතියික උකස් බැඳුම්කරය අංක 2217 සහ 2015.07.29 වැනි දින දරන තෘතීයික උකස් බැඳුම්කරය ද,

මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපල සම්බන්ධයෙන් එකී නොතාරිස් තැන විසින් ම සහතික කරන ලද අංක 1759 සහ 2014.08.01 වැනි දින දරන ප්‍රාථමික උකස්

බැඳුම්කරය අංක 1836 සහ 2014.09.04 වැනි දින දරන ද්විතියික උකස් බැඳුම්කරය අංක 2221 සහ 2015.07.29 වැනි දින දරන තෘතීයික උකස් බැඳුම්කරය ද, මෙහි පහත තුන්වන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපල සම්බන්ධයෙන් එකී නොතාරිස් තැන විසින් ම සහතික කරන ලද අංක 1832 සහ 2014.09.04 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය අංක 2225 සහ 2015.07.29 වැනි දින දරන ද්විතියික උකස් බැඳුම්කරය අංක 2689 සහ 2016.10.07 වැනි දින දරන තෘතීයික උකස් බැඳුම්කරය ද, මෙහි පහත හතරවන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපල සම්බන්ධයෙන් එකී නොතාරිස් තැන විසින් ම සහතික කරන ලද අංක 1548 සහ 2014.01.27 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය අංක 1891 සහ 2014.10.24 වැනි දින දරන ද්විතියික උකස් බැඳුම්කරය සහ 2219 සහ 2015.07.29 වැනි දින දරන තෘතීයික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, ඉහත කී මුල්‍ය පහසුකම් මත ලියාපදිංචි අංක පීබී 676, පීකිව් දරන යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු ඇතැම් තැනක "යුනියන් බැංකුව" වශයෙන් හඳුන්වන) වෙත අයවිය යුතු රුපියල් තුන්කෝටියක (රු. 30,000,000.00) මුදල සහ ඒ මත අයවිය යුතු පොලිය ගෙවීම සඳහා මෙහි පහත උපලේඛනවල සවිස්තරව දැක්වෙන දේපල ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඒ අනුව ඉහත කී ණය පහසුකම් නිසා 2018.02.05 වැනි දිනට මුළු හිඟ මුදල වන රුපියල් තුන්කෝටි පහළොස්ලක්ෂ පනස්දහස් හත්සියහැටහතකුත් ශත එකොළහක (රු. 31,550,767.11) මුදලක් සහ හිඟ මුල් මුදල වන රුපියල් තුන්කෝටියක (රු. 30,000,000.00) මුදල මත 2018.02.06 වැනි දින සිට දේපල විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 18.50% තවදුරටත් පොළිය එකී බන්ධනදායිගෙන් යුනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය හෝ ඉන් යම් කොටසක් එකී බන්ධනදායි විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. තිසේරා විසින් සහතික කරන ලද අංක 1756 සහ 2014.08.01 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය අංක 1834 සහ 2014.09.04 වැනි දින දරන ද්විතියික උකස් බැඳුම්කරය අංක 2217 සහ 2015.07.29 වැනි දින දරන තෘතීයික උකස් බැඳුම්කරය අංක 1759 සහ 2014.08.01 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය අංක 1836 සහ 2014.09.04 වැනි දින දරන ද්විතියික උකස් බැඳුම්කරය, අංක 2221 සහ 2015.07.29 වැනි දින දරන තෘතීයික උකස් බැඳුම්කරය, අංක 1832 සහ 2014.09.04 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය, අංක 2225 සහ 2015.07.29 වැනි දින දරන ද්විතියික උකස් උකස් බැඳුම්කරය, අංක 2689 සහ 2016.10.07 වැනි දින දරන තෘතීයික උකස් බැඳුම්කරය අංක 1548 සහ 2014.01.27 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය, අංක 1891 සහ 2014.10.24 වැනි දින දරන ද්විතියික උකස් බැඳුම්කරය සහ 2219 සහ 2015.07.29 වැනි දින දරන තෘතීයික උකස් බැඳුම්කරය ප්‍රකාරව යුනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත 1 වන, 2 වන, 3 වන සහ 4 වන උපලේඛනවල සවිස්තරව දක්වා ඇති දේපල, ඉහත කී මුල්‍ය පහසුකම් මත 2018.02.05 වැනි දිනට මුළු හිඟ මදල වන රුපියල් තුන්කෝටි පහළොස්ලක්ෂ පනස්දහස් හත්සියහැට හතකුත් ශත එකොළහක (රු. 31,550,767.11) මුදලක් සහ හිඟ මුල් මුදල වන රුපියල් තුන්කෝටියක (රු. 30,000,000.00) මුදල මත 2018.02.06 වැනි දින සිට දේපල විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 18.50% තවදුරටත් පොළිය ද, තව ද ඉහත කී උකස් බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වැනි වගන්තිය යටතේ යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළු ම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂිනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවන උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලයේ, යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 531B දරන මැද තෝඩුවාව ග්‍රාම නිළධාරි වසමේ, දකුණු තෝඩුවාව ගමේ පිහිටි තෝඩුවාව එස්ටේට් සහ පලුගහහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1712 සහ 1999.04.14 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කළ කැබලි අංක 02 දරන බිම් කොටසට මායිම්, උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : අංක 4473 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක D ද, දකුණට : අංක 1712 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 01 ද, බස්නාහිරට : 1712 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 03 (අඩි 08ක් පළල පාර සඳහා වෙන්කිරීම) ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස්හතකුත් දශම තුනයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 37.32) විශාල බිම් කොටස සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමඟ ය. මෙම දේපල මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 165/55 සහ 56 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

මෑතකාලීනව සිදු කරන ලද මැනීමට අනුව ඉහත කී ඉඩම පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලයේ, යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 531B දරන මැද තෝඩුවාව ග්‍රාම නිළධාරි වසමේ, දකුණු තෝඩුවාව ගමේ පිහිටි තෝඩුවාව එස්ටේට් සහ පලුගහහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 5064 සහ 2011.02.04 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කළ කැබලි අංක 01 දරන බිම් කොටසට මායිම්, උතුරට : ඇන්තනී මාවත ද, නැගෙනහිරට : අංක 4473 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක D ද, දකුණට : අංක 1712 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 01 ද, බස්නාහිරට : 1712 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 03 (අඩි 08ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස්හතකුත් දශම තුනයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 37.32) විශාල බිම් කොටස සහ ඒ මත පිහිටි සෑම සියළු දේත් සමඟ ය.

තව ද, ඉහත කී ඉඩමට මෙහි පහත විස්තර කරන ඉඩම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමඟ ය.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළයේ, යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 531 B දරන මැද තෝඩුවාව ග්‍රාම නිලධාරි වසමේ, දකුණු තෝඩුවාව ගමේ පිහිටි තෝඩුවාව එස්ටේට් සහ පලුගහහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1712 සහ 1999.04.14 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කළ කැබලි අංක 03 දරන බිම් කොටසට (අඩි 08 ක් පළල පාර සඳහා වෙන් කිරීම) මායිම්, උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : අංක 1712 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 02 ද, දකුණට : අංක 1712 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 01 ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු වර්නන් පෙරේරා විසින් මැන සාදන ලද අංක 2061 සහ 1964.11.21 වැනි දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක E1 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හතරකුත් දශම පහයි නවයක් (අ. 0, රූ. 0, පර්. 4.59) විශාල බිම් කොටස සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග ය.

### දෙවන උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළයේ, යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු තෝඩුවාව ග්‍රාම නිලධාරි වසමේ, තෝඩුවාව ගමේ පිහිටි පලුගහවත්ත අංක D480 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩෙන්වර් ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 7391 සහ 1992.11.18 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කළ කැබලි අංක 1B දරන බිම් කොටසට මායිම්, උතුරට : රංජනී පෙරේරා යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එම්. ඩී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 7391 දරන පිඹුරේ නිරූපි කැබලි අංක 2 ද, දකුණට : ග්‍රේස් මේරි ලුසිඩා යන අයගේ ඉඩම ද, බස්නාහිරට : ඉහත කී අංක 7391 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1A ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසිදෙකකුත් දශම අටයි හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 22.875) විශාල බිම් කොටස සහ ඒ මත පිහිටි සෑම සියලු දෙත් සමගය. මෙම දේපළ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 165/57 සහ 58 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

මෑතකාලීනව සිදු කරන ලද මැනීමට අනුව ඉහත කී ඉඩම පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළයේ, යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු තෝඩුවාව ග්‍රාමසේවා නිලධාරි වසමේ තෝඩුවාව ගමේ පිහිටි වරිපනම් D480 දරන පලුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්.එස්.ඒ. ෆොන්සේකා විසින් මැන සාදන ලද අංක 0049 සහ 2012.05.06 වැනි දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කළ කැබලි අංක 2 දරන බිම් කොටසට මායිම්, උතුරට : කිංස්ලි ඩයස් යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : ග්‍රේස් මේරි ලුසිඩා යන අයගේ ඉඩම ද, දකුණට : ග්‍රේස් මේරි ලුසිඩා යන අයගේ ඉඩම ද, බස්නාහිරට : ඉහත කී අංක 0049 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 3 (අඩි 10 ක් පළල පාර) සහ එකී අංක 0049 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 සහ බලයලත් මිනින්දෝරු එම්.ඩී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 7391 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1A දරන බිම් කොටසේ ඉතිරි බිම් කොටස ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සකුත් දශම හයක් (අ. 0, රූ. 0, පර්. 20.6) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග ය.

තව ද, ඉහත කී ඉඩමට මෙහි පහත විස්තර කරන ඉඩම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළයේ, යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු තෝඩුවාව ග්‍රාමසේවා නිලධාරි වසමේ තෝඩුවාව ගමේ පිහිටි පලුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්.එස්.ඒ. ෆොන්සේකා විසින් මැන සාදන ලද අංක 0049 සහ 2012.05.06 වැනි දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කළ කැබලි අංක 03 දරන බිම් කොටසට (අඩි 10 ක් පළල පාර සඳහා වෙන් කිරීම) මායිම්, උතුරට : ඉහත කී අංක 0049 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 01 ද, නැගෙනහිරට : ඉහත කී අංක 0049 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 2 ද, දකුණට : ග්‍රේස් මේරි ලුසිඩා යන අයගේ ඉඩම ද, බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දෙකකුත් දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 2.2) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග ය.

### තුන්වන උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළයේ, යාගම් පත්තුවේ, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේනේපොල ග්‍රාමසේවා නිලධාරි වසමේ, හේනේපොල ගමේ පිහිටි හේනේපොල එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ.ඒ. විමලසේන විසින් මැන සාදන ලද අංක 2747B සහ 2013.05.10 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක 02 දරන බිම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු ඒ.ඒ. විමලසේන විසින් මැන සාදන ලද අංක 2747 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 02 ද, නැගෙනහිරට : එස්.ඒ. සුනිමල් සහ තවත් අයගේ ඉඩම සහ අඩි 12ක් පළල පාර ද, දකුණට : බලයලත් මිනින්දෝරු වර්නන් පෙරේරා විසින් මැන සාදන ලද 6501 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක B දරන ඉඩම් කැබැල්ලේ ඉතිරි බිම් කොටස ද, බස්නාහිරට : අංක 2747B දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 ද, යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර දෙකකුත් රූඩ් දෙකයි පර්චස් හයයි දශම පහක් (අ. 02, රූ. 02, පර්. 6.5) විශාල බිම් කොටස සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමගය . මෙම දේපළ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 13/107 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත. වර්තමානය වන විට F 13/125 දරන වෙළුම/පත්ඉරුවට ගෙනගොස් ඇත.

තව ද, ඉහත කී ඉඩමට මෙහි පහත විස්තර කරන ඉඩම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළයේ, යාගම් පත්තුවේ, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේනේපොල ග්‍රාමසේවා නිලධාරි වසමේ හේනේපොල ගමේ පිහිටි හේනේපොල එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ.ඒ. විමලසේන විසින් මැන සාදන ලද අංක 2747D සහ 2014.09.02 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක 01 දරන බිම් කොටසට (අඩි 12 ක් පළල පාර සඳහා වෙන් කිරීම) මායිම්,

උතුරට : එස්.ඒ. සුනිමල් සහ තවත් අයගේ ඉඩම ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර ද, දකුණට : මෙම ඉඩමේ ම ඉතිරි කොටස ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඒ.ඒ. විමලසේන විසින් මැන සාදන ලද අංක 2747B සහ 2013.05.10 වැනි දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 02 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තුනයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 3.6) විශාල බිම් කොටසය. මෙම දේපළ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 45/74 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

### සිව්වන උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළයේ, යටකලන් පත්තුවේ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවේ අංක 531 දරන මැදතෝඩුවාව ග්‍රාම නිලධාරි වසමේ මැදතෝඩුවාව ගමේ පිහිටි අංක පී48 දරන පලුගහහේන, අංක එම්48 දරන පලුගහහේන සහ තෝඩුවාව එස්ටේට් ඉඩමේ කොටසක් වන ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්.එෆ්.එච්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 4886 සහ 2005.08.13 වැනි දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කළ කැබලි අංක 02 දරන බිම් කොටසට මායිම්, උතුරට : ඇන්තනී මාවත ද, නැගෙනහිරට : අඩි 08ක් පළල පාර සහ විනිෆ්‍රීඩා සහ කීර්ති යන අයගේ ඉඩම ද, දකුණට : චන්ද්‍රානි සහ ජේන් යන අයගේ ඉඩම් ද, බස්නාහිරට : අංක 4886 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 01 ද, යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකකුත් පර්චස් පහයි දශම එකක් (අ. 0, රූ. 01, පර්. 5.1) විශාල බිම් කොටස සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 166/75 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06 - 540

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

නොච්චියාගම, රළපනාව ජනපදය, අංක 102 හි හීන්කෙන්ද මුදලිගේ වික්‍රමපාල මහතා සහ හීන්කෙන්ද මුදලිගේ ඉන්දික සනත් වික්‍රමපාල මහතා යන අයගේ ණය වගකීම් සඳහා උකස් කරන ලද නොච්චියාගම, රළපනාව ජනපදය අංක 102 හි පිහිටි දේපළ විකිණීම.

2018 පෙබරවාරි මස 20 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩී.යූ. මනෝදර විසින් සහතික කරන ලද 2013 සැප්තැම්බර් මස 20 වැනි දිනැති අංක 1103 දරන උකස් බැඳුම්කරය සහ 2016 ජුනි මස 09 වැනි දිනැති අංක 1924 දරන උකස් බැඳුම්කරය අනුව 2018.01.18 වැනි දින තෙක් අයිරාව මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් විසිදෙලක්ෂ තුන්දහස් හත්සිය පනස් දෙකයි ශත හතලිස් පහ (රු. 2,203,752.45) මුදල සමග රුපියල් මිලියන දෙකක (රු. 2,000,000.00) මුදල මත වසරකට සියයට දහසයයි දශම පහ (16.5%) බැගින් 2018.01.19 වැනි දින සිට තවදුරටත් පොළියක් ද ණය මත මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් තිස්හතර ලක්ෂ විසිතුන් දහස් එකසිය පනස් පහයි ශත දහහතරක (රු. 3,423,155.14) මුදල සමග රුපියල් තිස්එක් ලක්ෂ හැත්තෑ පන් දහසක (රු. 3,175,000.00) මුදලක් මත වසරකට සියයට දොළහයි දශම එකයි නවය (12.19%) බැගින් පොළියක් 2018.01.19 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හීන්කෙන්ද මුදලිගේ වික්‍රමපාල මහතා සහ හීන්කෙන්ද මුදලිගේ ඉන්දික සනත් වික්‍රමපාල මහතා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ඩී.යූ. මනෝදර විසින් සහතික කරන ලද 2013 සැප්තැම්බර් මස 20 වැනි දිනැති අංක 1103 දරන උකස් බැඳුම්කරය සහ 2016 ජුනි මස 09 වැනි දිනැති අංක 1924 දරන උකස් බැඳුම්කරය අනුව අයිරාව මත අයවිය යුතු රුපියල් විසිදෙලක්ෂ තුන්දහස් හත්සිය පනස් දෙකයි ශත හතලිස් පහක (රු. 2,203,752.45) මුදල සමග ණය මත රුපියල් තිස්හතර ලක්ෂ විසිතුන් දහස් එකසිය පනස් පහයි ශත දහහතරක (රු. 3,423,155.14) මුදල සමග 2018.01.19 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 26 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ, නොච්චියාගම ශාඛාවේ කළමනාකරු හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

එකී උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවේ, දකුණු විලච්චිය කෝරළේ, අංක 339 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මීගහවැව ග්‍රාමයේ පිහිටි "ස්ටේට්ලැන්ඩ්" නැමැති ඉඩමේ සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද F.C.P. 150/1 හි ලොට් 19 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ලොට් අංක 18 ද, නැගෙනහිරට : F.C.P. 151 ද, දකුණට : ලොට් අංක 20 ද, බස්නාහිරට : ලොට් අංක 69 ද මායිම්ව හෙක්ටයාර බිංදුවයි දශම එකයි නවයයි හතක (හෙක්ටයාර 0.197) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් සහ

වෙනත් සියලු දේ ද වේ. මෙය අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L.D.O.M/9/30 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු ඒ.එම්.බී. රත්නසිරි විසින් මැතකදී මැන සාදන ලද 2013.07.07 වැනි දිනැති අංක 6041 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී මීගහවැව ග්‍රාමයේ පිහිටි "ගොඩ ඉඩම" නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ.එම්.බී. රත්නසිරි විසින් සාදන ලද 2013.07.07 වැනි දිනැති අංක 6041 දන පිඹුරෙහි ලොට් අංක 1 ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : F.C.P.A හි ලොට් අංක 18 ද, නැගෙනහිරට : F.C.P.A 151 (ජල මාර්ග රක්ෂිතය) ද, දකුණට : F.C.P.A 150 හි ලොට් අංක 20 ද, බස්නාහිරට : F.C.P.A 150 හි ලොට් අංක 69 ද මායිම්ව රූඩ් එකයි පර්චස් තිස්හතයි දශම නවයක (අ. 0, රූ. 1. පර්. 37.9) හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම එකයි නවයයි හතයි බිංදුව (හෙක්ටයාර 0.1970) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

මෙම ඉඩම බැංකුවට උකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපෘති කළමනාකරුගේ පූර්ව අනුමැතිය ඔහුගේ 2013.07.10 වැනි දිනැති ඔහුගේ යොමු අංක RPM/T/L/LOAN/NO/04 සහ 2016.02.11 වැනි දිනැති ඔහුගේ යොමු අංක RPM/T/L/NOG/LDO/5-2-1 දරන ලිපියෙන් ලබාගෙන ඇත.

### දෙවන උපලේඛනය

*වෙන්කිරීම් :*

01. ඉඩම තුළ හෝ ඒ මත ඇති සියලු ඛණිජ (මෙම යෙදුමට මෙම ප්‍රදානයේදී වටිනා ගල් ද ඇතුළත් වේ.) වල හිමිකම සහ කැනීමට සෝදිසි කිරීමට, වැඩ කිරීමට හා එවන් ඛණිජ බැහැරට ගෙනයාමට ඇති අයිතිය රජය වෙත වෙන්කර තබා ඇත.

02. ඉඩමට අයිතිකරු වශයෙන් ඇති හිමිකම මෙම ප්‍රදානය කරනු ලබන දිනයට ඉඩම මත පවතින මාර්ග අයිතිය හෝ ඉඩම මත ඇති අනෙකුත් පරවශතාවන්ට යටත් වේ.

*කොන්දේසි :*

01. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් හෙක්ටයාර 0.101/අක්කර සහ ජලය සැපයිය හැකි ඉඩමෙන් හෙක්ටයාර/අක්කර .... වශයෙන් මෙහි නම් කොට නිශ්චිතව දක්වා ඇති බිම් ප්‍රමාණයකටම වඩා අඩු උප බෙදීම් ඒකකයක් මෙම ඉඩමෙන් බැහැර නොකළ යුතුය.

02. අයිතිකරු විසින් මෙහි ... ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතුය.

03. කිසිවකුට ඉහත කොන්දේසි 1 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරුවකු විය නොහැක.

04. කිසිවකුට ඉහත කොන්දේසි 2 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරුවකු විය නොහැක.

05. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රාදේශීය සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදන වලට අනුකූලව කටයුතු කළ යුතුය.

06. දිසාපතිගෙන් ලිඛිතව අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යන් හැරීම, සෙවීම, භාවිතයට ගැනීම අයිතිකරු විසින් නොකළ යුතුය.

07. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතුය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්.එම්.පී.ආර්. සේමසිංහ,
කළමණාකරු.

2018 අප්‍රේල් මස 27 වැනි දින,
ලංකා බැංකුව,
නොච්චියාගම.

06 - 557

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

මැදිරිගිරිය, දියසෙන්පුර, පාසල් මාවතේ, ජයබිමලංකා පිරවුම්හලෙහි තනි අයිතිකාර වෙලේ මුදියන්සේලාගේ ජයසිරි අබේරත්න මහතාට අයත් අංක 88, දියසේනපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කවුඩුලුවැව අදියර I ග්‍රාමයෙහි පිහිටි "ගොඩ ඉඩම" හි උකස් කරන ලද දේපළ විකිණීම.

2018ක්වූ අප්‍රේල් මස 02 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන ගාල්ලගේ විසින් සහතික කරන ලද 2014 ඔක්තෝබර් මස 29 වැනි දිනැති අංක 2697

දරන උකස් බැඳුම්කරය සහ 2017 මාර්තු මස 07 වැනි දිනැති අංක 3232 දරන උකස් බැඳුම්කර අනුව 2017.07.27 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් විසිහත් ලක්ෂ තිස්දෙදහස් නවසිය හැටපහයි ශත හතලිස් එකක (රු. 2,732,965.41) මුදල සමග ලංකා බැංකු විශේෂ ණය සේවා ණය පහසුකම මත රුපියල් විසිහය ලක්ෂ හැටපන්දහස් හාරසිය දහතුනයි ශත අසූ දෙකක (රු. 2,665,413.82) මුදල මත වසරකට සියයට අට (8%) බැගින් 2017.07.28 වැනි දින සිට ගෙවීම නිම කරන තෙක් තවදුරටත් පොළියද ස්ථිර අයිරා පහසුකම මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් තිස්ලක්ෂ හැත්තෑහය දහස් හතයි ශත හයක (රු. 3,076,007.06) මුදල සමග රුපියල් විසිනව ලක්ෂ අනූඅට දහස් දෙසිය පනස් පහයි ශත පනස් හතක (රු. 2,998,255.57) මුදලක් මත වසරකට සියයට දහහත (17%) බැගින් 2017.07.28 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළියද මැදිරිගිරිය, දියසෙන්පුර, පාසල් මාවතේ, ජයබිම වෙලේ මුදියන්සේලාගේ ජයසිරි අබේරත්න යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. 2014.10.29 වැනි දිනැති අංක 2697 දරන උකස් බැඳුම්කරය සහ 2017.03.07 වැනි දිනැති අංක 3232 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් විසිහත් ලක්ෂ තිස්දෙදහස් නවසිය හැටපහයි ශත හතලිස් එකක (රු. 2,732,965.41) මුදල සමග රුපියල් තිස්ලක්ෂ හැත්තෑහය දහස් හතයි ශත හයක (රු. 3,076,007.06) බැගින් 2017.07.28 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත යුතු ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළකිරීමට ලංකා බැංකුවේ, මැදිරිගිරිය ශාඛාවේ කළමනාකරු හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

එකී උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ සිංහල පත්තුවේ, අංක 88 දරන දියසෙන්පුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කවුඩුලුවැව අදියර I ග්‍රාමයේ "ගොඩ ඉඩම" නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු එන්. මහාලිංගම් විසින් සාදන ලද 1996.09.16 වැනි දිනැති අංක NM/111 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : ලොට් අංක 142 සහ 141 ද, නැගෙනහිරට : ලොට් අංක 2 ද, දකුණට : වාරිමාර්ග ඇල ද, බස්නාහිරට : ලොට් අංක 140 ද මායිම්ව අක්කර එකක (අ. 1, රූ. 0. පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ. මෙය පොළොන්නරුව දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L.D.O F/7/85 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු පී.බී. ඉලංගසිංහ විසින් මෑතකදී මැන සාදන ලද 2014.06.01 වැනි දිනැති අංක 2014/PO/37 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී කවුඩුලුවැව අදියර I ග්‍රාමයේ "ගොඩ ඉඩම" නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී.බී. ඉලංගසිංහ විසින් සාදන ලද 2014.06.01 වැනි දිනැති අංක 2014/PO/37 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 01 උතුරට : F.C.P.Po 82 හි ලොට් අංක 142 සහ 141 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එන්. මහාලිංගම් විසින් සාදන ලද අංක NM/111 දරන පිඹුරෙහි ලොට් අංක 2 ද, දකුණට : පාර (වාරිමාර්ග දෙපාර්තමේන්තුව) ද, බස්නාහිරට : F.C.P.Po 82 හි ලොට් අංක 140 ද මායිම්ව අක්කර එකක (අ. 1, රූ. 0. පර්. 0) හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම හතරයි බිංදුවයි හතරයි හයක (හෙක්ටයාර 0.4046) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

මෙම ඉඩම බැංකුවට උකස් කිරීම සඳහා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ඔහුගේ 2014.07.16 සහ 2016.11.08 වැනි දිනැති ලිපි මගින් ඔහුගේ අංක එන්සීපී/එම්පී/එල්4/බැංකු/ඇප දරන යොමු අංකය යටතේ ප්‍රදානය කර ඇත.

### දෙවන උපලේඛනය

*වෙන්කිරීම් :*

01. ඉඩම තුළ හෝ ඒ මත ඇති සියලු ඛණිජ (මෙම යෙදුමට මෙම ප්‍රදානයේදී වටිනා ගල් ද ඇතුළත් වේ.) වල හිමිකම සහ කැනීමට සෝදිසි කිරීමට, වැඩ කිරීමට හා එවන් ඛණිජ බැහැරට ගෙනයාමට ඇති අයිතිය රජය වෙත වෙන්කර තබා ඇත.

02. ඉඩමට අයිතිකරු වශයෙන් ඇති හිමිකම මෙම ප්‍රදානය කරනු ලබන දිනයට ඉඩම මත පවතින මාර්ග අයිතිය හෝ ඉඩම මත ඇති අනෙකුත් පරවශතාවන්ට යටත් වේ.

*කොන්දේසි :*

01. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් ජලය සපයා ඇති ඉඩමෙන් අක්කර 1 1/2 වශයෙන් මෙහි නම් කොට නිශ්චිතව දක්වා ඇති බිම් ප්‍රමාණයකටම වඩා අඩු උප බෙදීම් ඒකකයක් මෙම ඉඩමෙන් බැහැර නොකළ යුතුය.

02. අයිතිකරු විසින් මෙහි අක්කර 1/7 ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතුය.

03. කිසිවකුට ඉහත කොන්දේසි 1 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරුවකු විය නොහැක.

04. කිසිවකුට ඉහත කොන්දේසි 2 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක

අයිතිකරුවකු විය නොහැක.

05. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රාදේශීය සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතුය.

06. දිසාපතිගෙන් ලිඛිතව අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයන් හෑරීම, සෙවීම, භාවිතයට ගැනීම අයිතිකරු විසින් නොකළ යුතුය.

07. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතුය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ.ජී.ඩී.පී. උදයරත්න මහතා,
කළමනාකරු.

2018 අප්‍රේල් මස 27 වැනි දින.
ලංකා බැංකුව,
මැදිරිගිරිය.

06 - 558

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම**

2018.05.02 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2011.12.12 වැනි දිනැති අංක 3165 සහ 2012.02.16 දිනැති අංක 3281 දරන උකස් බැඳුම්කර සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වීරසූරිය විසින් සහතික කරන ලද 2013.01.11 වැනි දිනැති අංක 2090 සහ 2014.06.04 වැනි දිනැති අංක 2549 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්.ටී. පෙරේරා විසින් සහතික කරන ලද 2017.04.24 වැනි දිනැති අංක 1686 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2011.02.10 වැනි දිනැති අංක 2573 දරන උකස් බැඳුම්කර අනුව 2018.04.18 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් ප්‍රතිලේඛනගත ණය A මත රුපියල් තුන්කෝටි විසිහය ලක්ෂ තිස්අට දහස් පන්සිය පනස් දෙකයි ශත හැත්තෑ හතරක (රු. 32,638,552.74) මුදල සමග රුපියල් දෙකෝටි අසූඅට ලක්ෂ හතලිස්දහස් හාරසිය නවයයි ශත අසූහයක (රු. 28,840,409.86) මුදල මත වසරකට සියයට දහසය(16%) බැගින් පොලියක් 2018.04.19 වැනි දින සිට ද, ප්‍රතිලේඛනගත ණය B මත අයවිය යුතු රුපියල් හැටඅට ලක්ෂ හාරදහස් අසූනවයයි ශත විසිහතක (රු. 6,804,089.27) මුදල සමග රුපියල් හැටහය ලක්ෂ විසිනව දහස් පන්සිය හැත්තෑ හයයි ශත දහහතන (රු. 6,629,576.17) මුදල මත 2018.04.18 වැනි දින සිට වසරකට සියයට හතර (4%) බැගින් පොලියක් 2018.04.19 වැනි දින සිට ද, මුල් මුදල හා පොලිය වශයෙන් කාලීන ණය මත රුපියල් එක්කෝටි හැටහත් ලක්ෂ අසූඅට දහස් හත්සිය හැටහතරයි ශත හැත්තෑ තුනක (රු. 16,788,764.73) මුදලක් සහ සහ රුපියල් එක්කෝටි හතලිස් හත් ලක්ෂ අනූහතර දහස් තිස්දෙකයි ශත හැටහය (රු. 14,794,032.66) මුදල මත 2018.04.18 වැනි දින සිට වසරකට සියයට දහසය (16%) බැගින් තවදුරටත් පොලියද 2018.04.19 වැනි දින සිට ගෙවීම නිම කරන දින තෙක් පානදුර, වෑකඩ, හොරණ පාරේ, අංක 155 හි දිනාලි බේකර්ස් ඇන්ඩ් පේස්ට්‍රි ෂොප් (පානදුර, වෑකඩ, හොරණ පාරේ, අංක 155 හි දැනට පදිංචි මාෂල හේවගේ සමන්ත ප්‍රසාද් මයා සහ පතිරගේ දොන් ප්‍රියන්ගිකා පීරිස් මිය හවුල්කරුවෝ වෙති) වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2011.12.12 වැනි දිනැති අංක 3165 සහ 2012.02.16 දිනැති අංක 3281 දරන උකස් බැඳුම්කර සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වීරසූරිය විසින් සහතික කරන ලද 2013.01.11 වැනි දිනැති අංක 2090 සහ 2014.06.04 වැනි දිනැති අංක 2549 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්.ටී. පෙරේරා විසින් සහතික කරන ලද 2017.04.24 වැනි දිනැති අංක 1686 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2011.02.10 වැනි දිනැති අංක 2573 දරන උකස් බැඳුම්කර මත ප්‍රතිලේඛනගත ණය A මත අයවිය යුතු රුපියල් තුන්කෝටි විසිහය ලක්ෂ තිස්අට දහස් පන්සිය පනස් දෙකයි ශත හැත්තෑ හතරක (රු. 32,638,552.74) මුදල සමග ප්‍රතිලේඛනගත ණය B මත අයවිය යුතු රුපියල් හැටඅට ලක්ෂ හාරදහස් අසූනවයයි ශත විසිහතක (රු. 6,804,089.27) මුදල සමග කාලීන ණය මත අයවිය යුතු රුපියල් එක්කෝටි හැටහත් ලක්ෂ අසූඅට දහස් හත්සිය හැටහතරයි ශත හැත්තෑ තුනක (රු. 16,788,764.73) මුදල මත 2018.04.19 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත යුතු ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර ටී. ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, පානදුර අධිශ්‍රේණි ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පානදුර නගර සභා සීමාවේ සහ අංක 687 දරන වෑකඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වෑකඩ පිහිටි බුලුගහවත්ත, සෙංකොණ්ඩයා කැටකැලගහවත්ත සහ කහටගහවත්ත හෙවත් කටකැලගහවත්ත නැමති ඉඩමට ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වගාවන්ද වෙනත් සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු පී. අජිත් පී ද සිල්වා විසින් සාදන ලද 2011 ජූලි මස 03 වැනි දිනැති අංක 317 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : අංක 4002 දරන පිඹුරෙහි ලොට් A හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : අංක 4002 දරන පිඹුරෙහි එම ඉඩමේ ලොට් B සහ ලොට් 2 ද, දකුණට : ලොට් අංක 2 සහ මහා මාර්ගය ද, බස්නාහිරට : අංක 3110 දරන පිඹුරෙහි එම ඉඩමේ ලොට් 4 ද මායිම්ව එකී අංක 317 දරන පිඹුරට අනුව පර්චස් දහසයක (අ. 0, රූ. 0. පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 04/132 හි ලියාපදිංචි කර ඇත.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ (තන්තිරිමුල්ල උප කාර්යාලය) බටහිර මාලමුල්ල (684 A) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාලමුල්ල ග්‍රාමයේ පිහිටි ගොඩපොරගහවත්ත (ගොඩපොරගහවත්ත කට්ටිය ලෙස ලියාපදිංචි) නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වගාවන් සහ වෙනත් සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ජේ.එන්. වික්‍රමරත්න විසින් සාදන ලද 2002 මැයි 1 වැනි දිනැති අංක 1039 දරන පිඹුරෙහි ලොට් 22A1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 22A1 උතුරට : පානදුර සිට නිවාස දක්වා පාර ද, නැගෙනහිරට : 2002 මැයි 1 වැනි දිනැති අංක 1039 දරන පිඹුරෙහි ලොට් 22A3 (ප්‍රවේශ මාර්ගය) ද, දකුණට : 2002.05.01 වැනි දිනැති අංක 1039 දරන පිඹුරෙහි ලොට් 22A2 ද, බස්නාහිරට : වයි.බී.කේ. කොස්තා විසින් සාදන ලද 2001.10.27 වැනි දිනැති අංක 3257 දරන පිඹුරෙහි ලොට් 22 හි ඉතිරි කොටස ද මායිම්ව අංක 1039 දරන පිඹුරට අනුව පර්චස් දහයක (අ. 0, රූ. 0. පර්. 10) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D328/24 හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

මාලමුල්ල ග්‍රාමයේ පිහිටි ගොඩපොරගහවත්ත (ගොඩපොරගහවත්ත කට්ටිය ලෙස ලියාපදිංචි) ඉඩමෙහි අංක 1039 දරන එකී පිඹුරෙහි ලොට් 22A3 (පාරට වෙන් කල කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 22A3 උතුරට : පානදුර සිට නිවාස දක්වා පාර ද, නැගෙනහිරට : අංක 1039 දරන පිඹුරෙහි ලොට් 22A4 සහ 22A5 ද, දකුණට : අංක 1039 දරන පිඹුරෙහි ලොට් 22A6 ද, බස්නාහිරට : අංක 1039 දරන පිඹුරෙහි ලොට් 22A2 සහ 22A1 ද මායිම්ව අංක 1039 දරන පිඹුරට අනුව පර්චස් තුනයි දශම හයක (අ. 0, රූ. 0. පර්. 3.6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D07/51 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එල්. කේ. ගමගේ මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී.

ලංකා බැංකුව,
පානදුර අධිශ්‍රේණි ශාඛාව.

06 - 559

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.